ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම - 2021

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.)2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු බහාලුම් තැන්පතු රු. මිලියන 5.1 කි. 2002 වසරේ සිට ගෙවිය යුතු දිගු හිඟ මුදල් මෙයට ඇතුළත් වේ. සමාගම තවමත් එවැනි හිඟ මුදල් අය කර ගැනීමට අපොහොසත් වී ඇත. | රු. 5,083,981ක කන්ටේනර් තැන්පතු ශේෂයක් සඳහා 2018 ගිණුම් පොත්වල රු. 4,408,221 ක් ප්‍රතිපාදන සඳහා වෙන්කිරීමක් සිදු කර ඇත. | සමාගම හැකි ඉක්මනින් හිඟ ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ.)සමාගම විසින් LP ගෑස් ආනයනයේදී අවලංගු කරන ලද නැව්ගත කිරීම් සඳහා 2013 සහ 2019 දී වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද ලෙස පිළිවෙලින් රුපියල් මිලියන 15.5 සහ මිලියන 29.8 ගෙවා ඇත. කෙසේ වෙතත්, සමාගම එම ශේෂයන් රේගු දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණේ නැත. | රු. 15,478,747ක් සඳහා 2020 ගිණුම් පොත් තුළ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර තිබූ අතර PAL සඳහා ලැබිය යුතු මුදල රු. මිලියන 15.5 කි. | සමාගම හැකි ඉක්මනින් හිඟ ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.6 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිටපු සභාපති/ප්‍රධාන විධායක නිලධාරියා 2020 අගෝස්තු මාසයේදී සියයට බිංදුවක පොලී අනුපාතයක් සහිතව රුපියල් මිලියන 9.753 ක වාහන ණයක් ලබාගෙන ඇති අතර එම ණය මුදලින් සියයට 50 ක් වන රුපියල් මිලියන 4.876 සමාගම විසින් දරනු ඇත. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරය විසින් එම තනතුර ප්‍රතිස්ථාපනය කිරීම හේතුවෙන් වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ නොකළ බැවින් සමාගම විසින් දරන ලද සියයට 50 ක කොටස ඇතුළුව හිඟ මුළු ණය මුදල 2021 ජූලි 20 වන දින හිටපු සභාපති / ප්‍රධාන විධායක නිලධාරියා විසින් පියවා ඇත. | හිටපු සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව සභාපතිවරයා ලෙස නොව ප්‍රධාන විධායක නිලධාරියාට හිමි වරප්‍රසාද පමණි. | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන ගැටුම්කාරී භූමිකාවන් දෙක වෙන් කිරීම නිර්දේශ කෙරේ. කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමය තවදුරටත් සමාලෝචනය කර ණය මුදල සම්පූර්ණයෙන් අය කර ගැනීම සහ ලබා දී ඇති කාර්ය මණ්ඩල ණය සඳහා සාධාරණ පොලියක් අය කිරීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 ජූලි 18 දිනැති අංක 03/2018 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | (i) එම චක්‍රලේඛයට අනුව ඉදිරියේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයන් බඳවා ගැනීමෙන් සහ ඔවුන්ගේ සේවකයන්ගේ වැටුප් හා දීමනා වැඩි කිරීමෙන් අදාළ බලධාරීන් | සමාගමේ සංගමික ව්‍යවස්ථාවට අනුව සභාපති සහ අධ්‍යක්ෂක විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩල වැටුප් පරාසයන් සහ දීමනා යෝජනා ක්‍රම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් | සමාගමේ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමේදී අදාළ බලධාරීන් විසින් කලින් කලට නිකුත් කරන උපදෙස් වලට සමාගම අනුගත විය යුතු අතර මුදල් අමාත්‍යාංශයේ |

| | | |
|---|---|---|
| වැළකී සිටිය යුතුය. | අනුමැතිය ලබා ගැනීමට මානව සම්පත් සඳහා පරිවයක් නොමැත. | විධානයන්ට අනුව පරිචය වෙනස් විය යුතුය. |
| (ii)2020 සහ 2021 වසර තුල සමාගමේ නිලධාරීන් විසි දෙදෙනෙකු සඳහා ශුන්‍ය පොලී අනුපාතය යටතේ රුපියල් මිලියන 127.06 ක කාර්ය මණ්ඩල වාහන ණය ප්‍රදානය කර තිබුණි. ණය මුදලින් සියයට පනහක් වූ රු. මිලියන 63.53 ක් සමාගම විසින් දරනු ලැබේ. | සීමාසහිත ෂෙල් ගෑස් ලංකා සමාහම විසින් මෝටර් රථ ප්‍රතිපත්තිය හඳුන්වා දුන් අතර පසුව සමාගම විසින් බොහෝ සංශෝධන සිදු කරන ලදී. සභාපතිවරයා සමාගමේ සංගමික ව්‍යවස්ථාව යටතේ අනුකමිටුවක් පත් කර ඇත. ඔවුන් දැනට පවතින මෝටර් රථ ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීම නිර්දේශ කර ඇත. | ලැදියාවන් අතර ගැටුමක් නිරීක්ෂණය වී ඇති බැවින් පත් කරන ලද අනුකමිටුව විසින් කරන ලද නිර්දේශ පිළිගත නොහැක. එබැවින් අනෙකුත් රජයේ සමාගම් මෙන් ණය මුදල සම්පූර්ණයෙන් අයකර ගැනීම සහ ණය සඳහා සාධාරණ පොලියක් අය කිරීම නිර්දේශ කෙරේ. වැඩිදුර උපදෙස් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත හැක. |
| (iii.)2020 සැප්තැම්බර් මාසය තුළ ශුන්‍ය පොලී අනුපාතයක් යටතේ සමාගමේ නිලධාරීන් 33 දෙනෙකු සඳහා රුපියල් මිලියන 251 ක රැකියා ආශ්‍රිත වාහන ණය ප්‍රදානය කර ඇත. | සමාගමේ මෝටර් රථ ණය ප්‍රතිපත්තියට අනුකූලව රැකියා ආශ්‍රිත වාහන ණය ද ලබා දෙන ලදී. ෂෙල් සමාගම් කාලය තුල පවා භුක්ති විඳි ප්‍රතිලාභයකි. | අනෙකුත් රාජ්‍ය සමාගම් විසින් ක්‍රියාත්මක කරන පරිදි ණය මුදල සම්පූර්ණයෙන් අයකර ගැනීමටත් සාධාරණ පොලියක් අය කිරීමටත් නිර්දේශ කෙරේ. වැඩිදුර උපදෙස් මහා භාණ්ඩාගාරයෙන් ලබාගත හැක. |
| (iv.)JG 1-5 කාණ්ඩයේ නිලධාරීන් 27 දෙනෙකු සඳහා 2020 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි මාසික වාහන දීමනාව 30% කින් වැඩි කර ඇත. නව මාසික වාහන දීමනාව රු. 143,000 සිට රු. 443,300 අතර වේ. | කමිටු නිර්දේශ වලට සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද Litro Gas Lanka Ltd හි මෝටර් රථ ප්‍රතිපත්තියට අනුකූලව දිමනා ගෙවනු ලබයි. | අනුකමිටු සාමාජිකයින් ද යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභින් වේ. එබැවින්, අදාළ බලධාරීන් විසින් නිකුත් කරන ලද උපදෙස් පිළිපැදීම නිර්දේශ කරනු ලබන අතර අත්‍යවශ්‍ය අපගමනය අවශ්‍ය නම් මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත හැකිය. |
| (v.)JG 6-9 කාණ්ඩයේ රැකියා ආශ්‍රිත වාහන ණය සඳහා හිමිකම් ඇති නිලධාරීන් 33 දෙනෙකු සඳහා මාසික වාහන | කමිටු නිර්දේශ වලට සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ලිට්‍රෝ ගෑස් ලංකා | සමාගම මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් |

| | | |
|---|---|---|
| දීමනාව 2020 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දී ඇත. මාසික වාහන දීමනාව රු. 100,000 සිට රු. 140,000 අතර වේ. | සමාගමේ හි මෝටර් රථ ප්‍රතිපත්තියට අනුකූලව දිමනා ගෙවනු ලබයි. | පිළිපැදිය යුතුය. මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් ද අනුකමිටු සාමාජිකයින් වන බැවින් ලැදියාව අතර ගැටුමක් නිරීක්ෂණය වී ඇති බැවින් අනුකමිටුව විසින් කරන ලද නිර්දේශ පිළිගත නොහැක. |
| (vi.) රැකියා ආශ්‍රිත වාහන ණය සඳහා හිමිකම් නොලබන JG 6-9 කාණ්ඩයේ නිලධාරීන් සඳහා මාසික වාහන දීමනාව 2020 අගෝස්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කර ඇත. නව මාසික වාහන දීමනාව රු. 15,000 සිට රු. 50,000 අතර වේ. | කමිටු නිර්දේශ වලට සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමේ හි මෝටර් රථ ප්‍රතිපත්තියට අනුකූලව දිමනා ගෙවනු ලබයි. | සමාගම මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. කිසියම් අපගමනයන් අත්‍යවශ්‍ය නම්, මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් සහ පූර්ව අනුමැතිය ඉල්ලා සිටිය යුතුය. |
| (vii.) සමාගමේ එක් එක් පුද්ගලයාගේ 2020 දෙසැම්බර් 31 දිනට පවතින ලද වැටුප මත 5% - 40% වෙළඳපල ගැලපීම මත පදනම්ව වැටුප් සංශෝධනයක් සිදු කර ඇත. නව වැටුප රු. 32,972 සිට රු. 1,610,000 අතර වේ. | පරිචයක් ලෙස සමාගමේ වේතන ප්‍රතිලාභ තීරණය කරනු ලබන්නේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය මත වැටුප් හා ප්‍රතිලාභ සමීක්ෂණය ක්‍රියාත්මක කිරීම PWC විසින් සිදු කරන ලදී. වැටුප් කමිටු නිර්දේශ අනුව සියලුම කාර්ය මණ්ඩල වැටුප් ක්‍රියාත්මක කර ඇති අතර සේවක ව්‍යූහ සහ වැටුප් ව්‍යූහය පිළිබඳ සියලු විස්තර ඇතුළත් ලිපියක් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | අදාළ බලධාරීන් විසින් කලින් කලට නිකුත් කරන ලද උපදෙස්වල වෙනස්කම් අනුව සමාගමේ පරිචය සකස් කළ යුතුය. කිසියම් අපගමනයක් අවශ්‍ය නම්, මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් සහ පූර්ව අනුමැතිය ඉල්ලා සිටිය යුතුය. |
| (viii.) සමාගමේ සභාපති සහ විකුනුම් අධ්‍යක්ෂක ට පිළිවෙලින් රුපියල් 150,000 ක සහ රුපියල් 100,000 ක මාසික විනෝදාස්වාද දීමනාව ගෙවනු ලැබේ. | සමාගම තුළ MD/CEO හට මාසික ගෙවීමක් සිදු කිරීම අඛණ්ඩ පරිචයකි. විනෝදාස්වාද දීමනාව ඇතුළුව ප්‍රධාන විධායක නිලධාරියාගේ වේතනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර | සමාගමේ සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ පරස්පර භූමිකාවන් දෙකක් තනි පුද්ගලයකු විසින් දරන බැවින් ඔහුගේම ප්‍රතිලාභ තීරණය කිරීමේදී |

| | | | |
|---|---|---|---|
| | | සමාගම නිසි අමාත්‍යාංශයට සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට නිසි ලෙස දැනුම් දෙන ලදී. | ලැදියාව අතර ගැටුමක් ඇති වේ. එබැවින් සමාගම මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ සහ 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 01/2015(i) රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය. | චක්‍රලේඛවලට අනුව, ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරක් දරන සහ ඕනෑම SOE එකක HM 1-1 කාණ්ඩයට සමාන හෝ ඉහළින් ස්ථානගත කර ඇති ඕනෑම නිලධාරියෙකුට එක් නිල වාහනයක් පමණක් භාවිතා කිරීමට අයිතියක් ඇත. මසකට පිළිවෙළින් ලීටර් 140 සහ 120 ට සමාන ඉන්ධන දීමනාවක් සහ ඉහත නිලධාරීන්ට නිල වාහනයක් හෝ රුපියල් 50,000 ක මාසික දීමනාවක් සහ මාසික ඉන්ධන දීමනාවක් ලබා දිය හැකිය. චක්‍රලේඛවලට පටහැනිව;<br><br>(i.) නිල වාහනයට හිමිකම් නොලබන ඇතැම් නිලධාරීන්ට නිල වාහන හෝ මාසික දීමනාවක් ලබා දී තිබුණි.<br><br>(ii.) රුපියල් 50,000 ක මාසික දීමනාව ඉක්මවා මාසික වාහන දීමනාව රු. 100,000 සිට රුපියල් 371,800 ක් නිලධාරීන් පනස් නව දෙනෙකු (59) සඳහා ගෙවා ඇත.<br><br>(iii.) නිලධාරීන් පනස් නව දෙනෙකු (59) සඳහා මාසික ඉන්ධන දීමනාව වන ලීටර් 140 හෝ 120 ඉක්මවන ලීටර් 200 සිට ලීටර් 550 දක්වා මාසික ඉන්ධන දීමනාව ලබා දේ. | චක්‍රලේඛයට අනුව, මෙම චක්‍රලේඛයේ දක්වා ඇති දීමනා ලිට්‍රෝ ගෑස් ලිමිටඩ් අනුබද්ධිත සමාගමක් යටතට වැටෙන බැවින් එයට අදාළ නොවේ. සභාපතිවරයාට, ප්‍රධාන විධායක නිලධාරියාට, අධ්‍යක්ෂ මණ්ඩලයට දීමනා ගෙවීම තරඟකාරී වෙළඳපල මිල ගණන් සැලකිල්ලට ගෙන අදාළ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. ඒ අනුව PED 01/2015 වෙනුවට සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකුගෙන් සමන්විත මණ්ඩලය විසින් අනුමත කරන ලද මෝටර් රථ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී. | ලැදියාව අතර ගැටුමක් නිරීක්ෂණය වී ඇති බැවින් අනුකමිටුව විසින් කරන ලද නිර්දේශ පිළිගත නොහැක. එබැවින්, චක්‍රලේඛ උපදෙස් පිළිපැදීම නිර්දේශ කරනු ලබන අතර යම් අපගමනය අත්‍යවශ්‍ය නම් උපදෙස් හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ)2020 ජනවාරි 27 දිනැති PED 01/2020 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය. | (i.)චක්‍රලේඛයට අනුව, ඕනෑම SOE හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ/විධායක අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ ජනරාල්වරයාට මසකට එක් නිල වාහනයක් සහ ලීටර් 150කට සමාන ඉන්ධන දීමනාවක් පමණක් භාවිතා කිරීමට හිමිකම් ඇත. ඉහත නිලධාරීන්ට නිල වාහනයක් හෝ රුපියල් 50,000 ක මාසික දීමනාවක් සහ මාසික ඉන්ධන දීමනාවක් ලබා ගත හැකිය. කෙසේ වෙතත්, එවැනි නිලධාරීන්ට රියදුරෙකු හෝ රියදුරු දීමනාවක් ලබා නොදෙනු ඇත. චක්‍රලේඛයට පටහැනිව,<br><br>- සභාපති/ප්‍රධාන විධායක නිලධාරී වෙත මාසික වාහන දීමනාව වන රුපියල් 50,000 ක මාසික දීමනාව ඉක්මවන රුපියල් 443,000 ක් ගෙවනු ලැබේ.<br><br>- මාසික ඉන්ධන දීමනාව වන ලීටර් 150 ඉක්මවන ලීටර් 500 ක මාසික ඉන්ධන දීමනාව සභාපති/ප්‍රධාන විධායක නිලධාරී වෙත ලබා දී තිබුණි.<br><br>- මාසික රියදුරු දීමනාව රුපියල් 50,000 ක් සභාපති/ප්‍රධාන විධායක නිලධාරියාට ගෙවනු ලැබේ.<br><br>(ii) චක්‍රලේඛයට අනුව, විධායක නොවන අධ්‍යක්ෂක (NED) සඳහා වන මුළු සහභාගී වීමේ දීමනාව මසකට රුපියල් 25,000 ක් වන අතර ඔහුට හිමිවන්නේ සහභාගී වීමේ දීමනාව පමණි. චක්‍රලේඛයට පටහැනිව; | සංගමික ව්‍යවස්ථාවලියේ අයිතම අංක 83, 76 , 77 ,78 වගන්තිවලට අනුව සහ 2020 පෙබරවාරි 21 සහ 2020 ජූලි 31 යන දිනයන්හිදී පැවති මණ්ඩල රැස්වීම් සංදේශයට අනුව සභාපති, විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ නිරීක්ෂකයින් සඳහා දීමනා ගෙවීම සහ ප්‍රවාහන පහසුකම් සැපයීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | සමාගමේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ ගැටුම්කාරී භූමිකාවන් දෙක තනි පුද්ගලයෙකු විසින් දරනු ලබයි. එබැවින්, ඔහුගේම ප්‍රතිලාභ තීරණය කිරීමේදී ලැදියාව අතර ගැටුමක් ඇති වේ. එබැවින් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියක් අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | - සහභාගී වීමේ දීමනාව තිදෙනාට (03) මණ්ඩල රැස්වීමකට රුපියල් 25,000ක් බැගින් ගෙවනු ලැබේ.<br><br>මාසික වාහන දීමනාව රු. 100,000 NEDs තිදෙනාට (03) ගෙවනු ලැබේ. | | |
| (ඈ)2018 දෙසැම්බර් 07 දිනැති අංක PED 03/2018 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛය. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව එක් සේවකයෙකුට රුපියල් 13,500 ක ප්‍රසාද දීමනාවට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ සේවකයෙකු සඳහා රුපියල් 60,000 ක ප්‍රසාද දීමනාවක් ගෙවා ඇත. | ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සහ ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම් දෙක සඳහාම CBA නොවන සේවකයින්ගේ වාර්ෂික කාර්ය සාධනය පදනම් කරගත් ප්‍රසාද දීමනාව තීරණය කරනු ලබන්නේ සාපේක්ෂ පුද්ගල කාර්ය සාධනය සහ සමාගමේ කාර්ය සාධනය මතය.ප්‍රසාද දීමනා ගෙවීමේ මාස ගණන CBA සේවකයාගේ ගෙවීමට සහ අපගේ මව් සමාගම වන SLIC විසින් ගෙවන මාස ගණනට අනුකූල විය යුතුය. ප්‍රසාද දිමනා ක්‍රමය වැටුප් කමිටුව විසින් නිර්දේශ කරන ලද අතර අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇත. | සමාගම චක්‍රලේඛයේ උපදෙස් පිළිපැදිය යුතුය. කිසියම් අපගමනයක් අවශ්‍ය නම් භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ. |
| (ඉ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ හි 8.3.3 (C) වගන්තිය. | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ප්‍රසාද යෝජනා ක්‍රමය යටතේ සමාගමේ සේවකයන් සඳහා රුපියල් මිලියන 43.91 ක් ගෙවා තිබුණි. | පිරවුම් මෙහෙයුම්, සිලින්ඩර නඩත්තු, මෙහෙයුම් සහ ප්‍රවාහනය වැනි සේවා රැසක් මැන්පවර් සේවකයින් 200කට අධික සංඛ්‍යාවක් විසින් හසුරුවන අතර වේතන කමිටුව විසින් නිර්දේශ ලබාගෙන 2020 සහ 2021 වසර සඳහා වැටුප් කමිටුවක් හරහා වත්මන් වැටුප් ව්‍යුහය සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. | සමාගම චක්‍රලේඛයේ උපදෙස් පිළිපැදිය යුතුය. කිසියම් අපගමනයක් අවශ්‍ය නම් භාණ්ඩාගාරයේ අනුමැතිය අවශ්‍ය වේ. |
| (ඊ.) සමාගමේ සභාපතිවරයාට එවන ලද 2021 | දැනට පවතින අඩු බරින් යුත් කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ සිලින්ඩරයට LP ගෑස් කිලෝග්‍රෑම් | 2021 අප්‍රේල් 20 දිනැති ලිපිය, නව හයිබ්‍රිඩ් සිලින්ඩරය හඳුන්වාදීමේ | අදාළ නියාමන ආයතන විසින් නිකුත් කරන ලද උපදෙස් සමඟ සමාගම |

| | | | |
|---|---|---|---|
| අප්‍රේල් 20 දිනැති පාරිභෝගික කටයුතු අධිකාරියේ ලිපිය. | 9.7ක් පුරවා පාරිභෝගිකයා නොමඟ යැවීම හේතුවෙන් නැවත දැනුම් දෙන තුරු ලීටර් 18 සුපිරි දෙමුහුන් LP ගෑස් සිලින්ඩරය වහාම ක්‍රියාත්මක වන පරිදි වෙළඳපොළෙන් ඉවත් කර ගන්නා ලෙස CAA සමාගමට නියෝග කර තිබුණි. දැනට පවතින 12.5Kg සිලින්ඩරවලට වඩා LPG ලීටර් 18 අඩු වන අතර ආසන්න වශයෙන් එය 9.7Kg ට සමාන වේ. කෙසේ වෙතත්, 2021 ජූලි දක්වා ලීටර් 18 ක සුපිරි දෙමුහුන් LP ගෑස් සිලින්ඩරයක් වෙළඳපොළට බෙදා හැර ඇත. | 9/4/2021 දිනැති ලිට්‍රෝ ලිපියට CAA විසින් පිළිතුරු දී ඇති මුල් ලිපියයි. කෙසේ වෙතත්, 2021 අප්‍රේල් 20 දිනැති එම ලිපියෙන් පසුව CAA විසින් ලිට්‍රෝ සමාගමෙන් 12.5Kg ප්‍රමාණවත් තොග පවත්වා ගැනීමට පමණක් ඉල්ලා ඇති නමුත් එම ලීටර් 18 සිලින්ඩරය වෙළඳපොළෙන් ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා නොමැති බව සහතික කිරීමට අදාළ ලියකියවිලි බොහොමයක් තිබේ. | නිසි ලෙස කටයුතු කළ යුතුය. |
| (උ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු අධිකාරී පනතේ (1)18වගන්තිය. | පාරිභෝගික කටයුතු අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව සමාගම විසින් ලීටර් 18 සුපිරි දෙමුහුන් සිලින්ඩරයක මිල රු. 236 කින් හෙවත් සියයට20 කින් වැඩි කර තිබුණි. ඒ අනුව, පාරිභෝගික කටයුතු අධිකාරියේ අනුමැතියකින් තොරව අලෙවි කරන ලද ලීටර් 18 සුපිරි දෙමුහුන් සිලින්ඩර ප්‍රමාණයට අදාළව වැඩි කරන ලද මුළු මුදල රු. බිලියන 1.22 ක් බව නිරීක්ෂණය විය. | 2.5kg, 5kg සහ 12.5 සිලින්ඩර සඳහා පමණක් මිල පාලනයක් හෝ CAA අනුමැතිය අවශ්‍ය වේ.CAA හි මිල පාලනය මඟහරවා ගැනීම සඳහා ව්‍යාපාරික ආකෘතියක් ලෙස සහ නව නිෂ්පාදනයක් ලෙස සමාගම ලීටර් 18 සිලින්ඩරය වෙළඳපොළට හඳුන්වා දීම CAA වෙත දැනුම් දී ඇති අතර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව නියෝජනය කරන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඇතිව ප්‍රතිපත්තියක් සහ උපායමාර්ගික පියවරක් ලෙස හඳුන්වා දෙන ලදී. | මිල නියාමනය කරන ලද නිෂ්පාදනයක් ලෙස අදාළ නියාමකයින් විසින් නිකුත් කරන ලද උපදෙස් සමඟ සමාගම නිසි ලෙස කටයුතු කළ යුතුය. |
| (ඌ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනත. | එම විධිවිධානවලට අනුව, සමාගම ඇතුළු රජය සතු සමාගම්වල විගණනය සිදු කිරීම සඳහා විගණකාධිපතිවරයා පත් කර ඇත. ඉහත විධිවිධානවලට පටහැනිව 2020 සඳහා සමාගමේ විගණනය සිදු කිරීම සඳහා බාහිර පරිචයේ යෙදෙන විගණකවරයෙකු පත් කර තිබූ අතර ඔවුන් 2020 සඳහා සමාගමේ විගණනය සිදු කර ඇත. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂයෙන්ම 154 ව්‍යවස්ථාවේ විගණකාධිපතිවරයාගේ විෂය පථයට අයත් ආයතන එහි විගණන කාර්යයන් සඳහා පැහැදිලිව දක්වා ඇත.<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනයේදී 154 වැනි ව්‍යවස්ථාව විශේෂයෙන් එහි සංශෝධනය කරන ලද සිංහල පාඨය අර්ථ ව්‍යාකූල | සමාගමේ ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමේදී රටේ නීතිය පිළිපැදීම සහ අඛණ්ඩතාව පවත්වා ගැනීම සඳහා මණ්ඩලය සහතික විය යුතුය. |

බව හා එමගින් කවර හෝ අපැහැදිලි බවක් ඇති බැවින් ඉවත් කරන ලදී. කෙසේ වෙතත්, LGLL සහ LGTLL විගණකාධිපතිවරයාගේ විගණනය යටතට පත් වන්නේද යන්න තහවුරු කර ගැනීම නීතිය පිළිබඳ ප්‍රශ්නයක් වන අතර එය තීරණය කළ යුත්තේ අධිකරණයක් විසින් මිස සමාගම හෝ නීතිපතිවරයා විසින් නොවේ.
ඉහත ස්ථාවරය අභියාචනාධිකරණය විසින් පිළිගෙන තිබුණේ එකී ක්‍රියාවන් පිළිබඳ නොතීසි නිකුත් කරමින් සහ සමාගම් දෙකෙහිම කටයුතු විගණනය කිරීම වළක්වාලමින් විගණකාධිපතිවරයාට අතුරු නියෝග ලබා දීමෙනි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,377,691,708 පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.83,947,583 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,461,639,291 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රු. 7,244,616,838 ක නිෂ්පාදනයේ පිරිවැය ආවරණය කිරීම සඳහා මිල නොගැලපීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන් පෙර වර්ෂ 2ක හා සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් ඇඟයීමට ලක්කර පහත පරිදි දක්වා ඇත.

| දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා, | වටිනාකම (රු. 000) | | | ප්‍රතිශත වෙනස | | |
|---|---|---|---|---|---|---|
| | 2021 | 2020 | 2019 | 2021 | 2020 | 2019 |
| ගනුදෙනුකරුවන් සමග එලබෙන ගිවිසුම් වල අයභාරය | 52,308,942 | 39,714,783 | 43,730,228 | 32% | -9% | 12% |
| විකුණුම් පිරිවැය | 59,553,559 | 37,392,413 | 36,489,126 | 59% | 2% | 0.24% |
| මෙහෙයුම් ලාභය හෝ අලාභය | (9,871,304) | (303,493) | 4,083,343 | -3153% | -107% | 1138% |
| මූල්‍ය ආදයම් | 276,479 | 678,964 | 878,588 | -59% | -23% | 34% |
| මූල්‍ය වියදම් | 575,350 | 291,358 | 34,669 | 97% | 740% | -93% |

### 2.3 අනුපාත විශ්ලේෂණය

ප්‍රධාන අනුපාත පෙර වර්ෂ 3 සමඟ සසඳා පහත පරිදී වේ.

| අනුපාත | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාත | 0.95% | 11.35% | 2.53% | -18.34% |
| ප්‍රාග්ධන ප්‍රතිලාභ අනුපාතය | 1.37% | 18.59% | 4.45% | -42.03% |
| හිමිකම් මත ප්‍රතිලාභය | 0.52% | 22.13% | 2.23% | -73.20% |
| වත්කම් පිරිවැටුම | 220.36% | 271.67% | 233.32% | 260.31% |
| වත්කම් ප්‍රතිලාභය | 1.21% | 16.52% | 4.02% | -31.64% |
| ජංගම අනුපාතය | 3.51 | 4.16 | 3.25 | 1.36 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 2.89 | 3.66 | 2.87 | 1.03 |
| මූල්‍ය තෝලනය | 1.95 | 1.89 | 1.81 | 3.01 |
| ණය වත්කම් අනුපාතය | 0.49 | 0.47 | 0.48 | 0.67 |
| ණය හිමකම් අනුපාතය | 0.95 | 0.89 | 0.87 | 2.01 |
| මුලු වගකීම් වලට ජංගම අනුපාතය | 0.25 | 0.24 | 0.20 | 0.37 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නෛතික ගාස්තු - 2020 වර්ෂය සඳහා සමාගමේ විගණනය සඳහා විගණකාධිපතිවරයා වෙනුවට ආදේශ කිරිම.<br><br>(i) 2020 වර්ෂය සඳහා සමාගමේ විගණනයෙන් විගණකාධිපතිවරයා වෙනුවට ආදේශ කිරීම සම්බන්ධයෙන් යෝජිත අභියාචනාධිකරණ රිට් අයදුම්පත සඳහා වෘත්තීය සේවාවන් ලබාගෙන තිබුණි. ඒ අනුව 2021 පෙබරවාරි 05 වන දින නීති උපදේශකයින් වෙත සමාගම විසින් රුපියල් මිලියන 2.6 ක් ගෙවා තිබුණි. | LGLL හී ව්‍යවස්තාවේ 4 වන වගන්තිය සහ LGTLL ව්‍යවස්තාවේ 19 වැනි වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක සේවයේ නියුක්ත කිරීමට, නඩත්තු කිරීමට, නියෝජිතයන් පත් කිරීමට හෝ සම්බන්ධ කර ගැනීමට සහ සුදුසු යැයි සිතිය යුතු එවැනි ගාස්තුවක් සහ එවැනි ගාස්තුවක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ලබාදේ.<br>ඒ අනුව ගරු නීතිපතිවරයා පෞද්ගලික සමාගම්වලට නීති උපදෙස් ලබා නොදෙන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය එකී ජනාධිපති නීතිඥවරයාගේ සේවය ඉල්ලා ඇත.<br>සමාගම් පනතේ විධිවිධාන අනුව තමන් කැමති විගණකවරයෙකු පත් කර ගැනීම සඳහා කොටස් හිමියන්ගේ උනන්දුව සහ අයිතිය සුරක්ෂිත කිරීමේ පියවරක් ලෙස, PWC විගණක ලෙස සිදු කල එම පත්වීමට විගණකාධිපතිවරයා විරුද්ධ වුවහොත් පෙනී සිටීමට සුදුසු නීතිඥයෙකුගේ සේවය සමාගම ඉල්ලා තිබුණි. | සමාගමේ කටයුතු සිදු කිරීමේ දී අධ්‍යක්ෂක මණ්ඩලය රටේ නීතියට,හිමිකාර සමාගමේ මගපෙන්වීම සහ භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් වලට අනුකූල විය යුතුය.<br><br>නීති උපදෙස් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් තිබේ නම්, සමාගම විසින් උපදේශකයින් තෝරා ගැනීමේදි හා සේවාව ගැනිමේ දි 2007 අගෝස්තු මස ශ්‍රී ලංකා ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද |

| | | |
|---|---|---|
| | එබැවින් එම මුදල ගෙවා ඇත්තේ එම නීතිඥවරයාට සහ ඔහුගේ කනිෂ්ඨයන් සඳහා නීතිඥවරයා ලෙස රඳවා තබා ගැනීම සඳහා ගරු අභියාචනාධිකරණ උපදේශන සඳහා, උපාය මාර්ගික සහ නීති උපදෙස් සඳහා ලිපි ලේඛන පරීක්ෂා කිරීම සඳහා, සහ පෙත්සම් සහ දිවුරුම් ප්‍රකාශය කෙටුම්පත් කිරීම සහ විසඳීම සඳහා වේ. | මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |
| (ii.) විගණකාධිපතිවරයාට නීතිමය බාධාවක් නොමැති බවට නීතිපතිවරයා සිය මතය ප්‍රකාශ කළ බැවින් තම මෙහෙයවීම යටතේ සමාගම්වල විගණනය තම නිලධාරීන් විසින් සිදු කරන බවට විගණකාධිපතිවරයා 2021 ජනවාරි 07 වැනි දින සමාගමට ලිපියක් යවා තිබුණි. ඉන් පසුව සමාගම රුපියල් මිලියන 1.5ක මුදලක් වැය කර එම ලිපිය සම්බන්ධයෙන් නීති මතය ලබාගෙන ඇත. | ඔබ දන්නා පරිදි සමාගමේ කටයුතු විගණනය කිරීම සඳහා විගණකාධිපති පත් කිරීම සමාගමේ කොටස් හිමියන්ට මහා සභා රැස්වීමකදී තීරණය කළ යුතු කාරණයක් වන අතර LGLL සහ LGTLL සඳහා බාහිර විගණකවරයෙකු පත්කිරීම සඳහා වන විරෝධතාව ද මහා සභා රැස්වීමකදී හෝ මහා සභා රැස්වීමට පෙර ඉදිරිපත් කළ යුතුය.කෙසේ වෙතත්, විගණකාධිපතිවරයාගේ එම ලිපිය ලැබුණේ මහා සභා රැස්වීමෙන් මාසයකට පසුවය, විගණකාධිපතිවරයා විසින් යොමු කරන ලද එම ලිපිය සම්බන්ධයෙන් ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතාගෙන් ලිඛිත නීති මතයක් විමසීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සිදුවිය.ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතාගෙන් සිදු කල මත විමසීම සඳහා ගෙවීම් එම මණ්ඩල පත්‍රිකාව අනුමත කර ඇත.<br>ඒ අනුව LGLL හි ව්‍යවස්තාවේ 4 වැනි වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුව එම ගාස්තුව ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා වෙත ගෙවීමට සමාගම පියවර ගෙන ඇත. | |
| (iii)නීති උපදෙස් ලබා ගැනීමෙන් පසු, සමාගම විසින් 2021 මැයි 22 දින අභියාචනාධිකරණයේ රිට් අයදුම්පත් ආරම්භ කර තිබුණේ විගණකාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත බලය අභියෝගයට ලක්කරමිනි.<br>කෙසේ වෙතත්, 2021 ජූලි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව සමාගම විසින් නඩුව ඉල්ලා අස්කර ගෙන තිබුණි. එම නඩුවට අදාළ නීති ගාස්තු රුපියල් මිලියන 8.1 ක් 2021 ජුනි මාසයේදී සමාගම විසින් ගෙවා තිබුණි. | ප්‍රධාන කොටස් හිමියා 2021 ජුලි 20 දිනැති ලිපිය මගින් LGLL හි අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් දී ඇත. 2021/7/22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමේ මූල්‍ය කටයුතු පරීක්ෂා කිරීම සඳහා විගණකාධිපතිවරයා පත් කිරීමට පියවර ගැනීමට තීරණය කරන ලදී. LGLL වෙත විගණකාධිපතිවරයා පත් කර ගැනීම සම්බන්ධයෙන් 2021/07/2021 දිනැති ලිපිය මගින් LGLL ප්‍රධාන කොටස් හිමියා විසින් 2021 අප්‍රේල් 23 වන දින ඉදිරිපත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම සැලකිල්ලට ගෙන අභියාචනා රිට් අයදුම්පත්‍ර අංක: CA Writ 286/2021 සහ CA Writ 287/2021 අධිකරණයෙන් ඉල්ලා අස්කර ගැනීමේ අවශ්‍යතාවය මතු විය. එහි දී අධිකරණය විසින් වගඋත්තරකරුවන්ට විධිමත් දැන්වීමක් නිකුත් කර විගණකාධිපතිවරයාට LGLL සමාගම 2021 සැප්තැම්බර් 21 දක්වා විගණනය කිරීම වළක්වා ඇත. එබැවින් විගණකාධිපතිවරයාට තම රාජකාරී කටයුතු ආරම්භ කළ හැක්කේ ඉහත සඳහන් අතුරු නියෝගය අධිකරණයෙන් නිෂ්ප්‍රභා කිරීමෙන් | |

| | | |
|---|---|---|
| | පසුව හෝ මෙම නඩු ඉල්ලා අස්කර ගැනීමෙන් පසුවය. අභියාචනාධිකරණය එකී ක්‍රියාමාර්ග පිළිබඳ නොතිසි නිකුත් කළ අතර විගණකාධිපතිවරයාට සමාගමේ කටයුතු විගණනය කිරීම වළක්වමින් අතුරු නියෝගයක් නිකුත් කළේය. | |
| (iv)එම කාරණයට අදාළව දැරූ රුපියල් මිලියන 12.2 මුළු වියදම ආර්ථික නොවන වියදම් ලෙස නිරීක්ෂණය විය | සමාගම වෙනුවෙන් අභියාචනාධිකරණයේ පෙනී සිටි කීර්තිමත් නීතිඥවරුන් මේ සම්බන්ධයෙන් සිය ස්ථාවර මතය ඉදිරිපත් කළහ. ශ්‍රී ලාංකේය නීති පද්ධතිය ඉංග්‍රීසි නීති ක්‍රමයේ නීතිඥ-සේවාදායක සබඳතාව පවත්වාගෙන යාමේ සම්ප්‍රදාය භාවිතයන් වලින් පොහොසත් ය. ගෙවීම් කිරීම සහ අනෙකුත් අදාළ කාරණා සම්බන්ධයෙන් මෙම ක්ෂේත්‍රයේ ව්‍යුහයක් හෝ අදාළ රීතියක් නොමැත. ඒ අනුව උසාවියේ නඩු පවරන්නාගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ හැකි කීර්තිමත් සහ දක්ෂ නීතිඥයෙකුට ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් සේවාදායකයාට කේවල් කිරීමේ බලයක් නොමැත. එම මුදල ආර්ථික නොවන වියදමක් ද යන්න තහවුරු කර ගැනීම සඳහා එම හෝ සමාන උපදේශකයන්ගේ නෛතික ගාස්තු පිළිබඳ වෙළඳපල සමීක්ෂණයක් කිරීම සුදුසුය. | |
| (ආ.) 2020 සහ 2021 වසර තුළදී තොග පාරිභෝගිකයන් 7 දෙනාට කුලී ගාස්තුවක් අය නොකර ටැංකි/වත්කම් සපයා ඇති අතර තවත් තොග පාරිභෝගිකයෙකුට මාසික කුලී ගාස්තු යටතේ ටැංකි දෙකක් සපයා ඇත. තවද, නොමිලයේ සපයනු ලබන ටැංකි/වත්කම්වල හිමිකාරිත්වය වසර 10ක කාලයක් සඳහා සමාගමට පවතින අතර, වසර 10ක කාලයෙන් පසුව, ටැංකි/වත්කම් ස්වයංක්‍රීයව පාරිභෝගිකයා වෙත පැවරෙනු ඇත. | පාරිභෝගිකයින්ගේ වැදගත්කම මත තරඟකරුට වඩා ප්‍රතිලාභ ලබා දීම සඳහා බොහෝ මෙවලම් (උපක්‍රම) භාවිතා කර ඇත. එසේම, ලිට්‍රෝ සමාගමට මෙට්‍රික් ටොන් 1300ක් පමණ අමතර පරිමාවක් ලැබී ඇති අතර එය මෙම සමූහයෙන් මෙට්රික් ටොන් 2500කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගත් අතර ටර්මිනල් අන්තිකය ඩොලර් 51ක් ලෙස ගත් බැවින් ටර්මිනල් සඳහා වර්ධක ආදායමක් ඇති වූ අතර සමාගම් දෙකේ ඒකාබද්ධ ආන්තිකය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළේය. | තොග විකුණුම් සඳහා සමාගමට අනුමත ප්‍රතිපත්තියක් තිබිය යුතු අතර පාරිභෝගිකයින්ට සාධාරණ ලෙස සැලකිය යුතුය. කිසියම් අපගමනය අත්‍යවශ්‍ය නම්, එය නිසි අධිකාරියක් සහිතව සිදු කළ යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාගම විසින් යොදන ලද විකුණුම් සහ අලෙවිකරණ ප්‍රතිපත්ති සහ මිලකරණ ප්‍රතිපත්ති යොමු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති බව නිරීක්ෂණය නොවීය. | විකුණුම් සහ අලෙවිකරණ ප්‍රතිපත්ති ඇතුළුව සංශෝධිත ප්‍රතිපත්ති අපි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කළෙමු. | අකාර්යක්ෂමතා මඟහරවා ගැනීමට සහ සිදුවිය හැකි විෂමාචාර වැළැක්වීම සඳහා සමාගමේ විකුණුම් කාර්යයන් මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්තිවලට අනුකූල බව සමාගම සහතික කළ යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.)සමාලෝචිත වර්ෂය සඳහා තොග ගනුදෙනුකරුවන්ගෙන් සහ වාණිජ ගනුදෙනුකරුවන්ගෙන් ආදායම පිළිවෙලින් රුපියල් බිලියන 7.98 ක් සහ රු. බිලියන 3.77 කි. පහත සඳහන් හේතූන් නිසා තොග පාරිභෝගිකයන් සහ වාණිජ ගනුදෙනුකරුවන් සඳහා මිල නියම කිරීමේ ප්‍රතිපත්තිය විනිවිද භාවයෙන් යුතු ප්‍රතිපත්තියක් බවට සහතික නොවීය.<br>(i.) එක් එක් පාරිභෝගිකයා සඳහා මිල තීරණය කිරීම සඳහා ආනයනික නිෂ්පාදන පිරිවැයට විවිධ වට්ටම් අනුපාත සහ ලාභාන්තිකය යොදා ගනු ලබයි. | වාණිජ අංශය ඉතා තරඟකාරී වන අතර තරඟකරුවන් විසින් ප්‍රතිලාභ ලබා දීමෙන් පාරිභෝගිකයන් ඉතා ආක්‍රමණශීලී වේ. | ගනුදෙනුවල විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා තොග සහ වාණිජ ගනුදෙනුකරුවන්ට සමාගම විසින් පිරිනමනු ලබන මිල සහ අනෙකුත් අදාළ සහන තීරණය කිරීම සඳහා සුදුසු අධිකාරිය විසින් අනුමත කරන ලද පැහැදිලි ප්‍රතිපත්තියක් සහ ක්‍රියාවලියක් තිබිය යුතුය. |
| (ii.)තවත් අවස්ථා වලදී එකම පාරිභෝගිකයා සඳහා මාසික පදනමින් මිල තීරණය කිරීම සඳහා විවිධ වට්ටම් අනුපාත යොදන ලදී. | තරඟකරුගේ ආක්‍රමණශීලී ප්‍රවේශය හේතුවෙන් කෙටි කාලීනව පරිමාව සහ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා විශේෂ වට්ටම් ලබා දී ඇත. | |
| (iii.)2020 සැප්තැම්බර් 26 සිට වැඩි පාරිභෝගිකයින් ප්‍රමාණයක් සඳහා මිල තීරණය කිරීම සඳහා ආනයනික නිෂ්පාදන පිරිවැයට ශුද්ධ වට්ටම් (දළ අලාභය) යොදවා තිබූ අතර ශුද්ධ වට්ටම් සහිත මෙම මිල සංශෝධනය සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අලවි පරිමාව සහ වෙළඳපල කොටස ලබා ගැනීම සඳහා විවිධ වට්ටම් සහ මිලකරණ විකල්පය භාවිතා කර ඇත. කොවිඩ් වසංගතය හේතුවෙන් කර්මාන්තයට සහ ජනතාවට තම ජීවනෝපාය නැවත ගොඩනඟා ගැනීමට සහාය වීම සඳහා මෙම කාල සීමාව තුළ වාණිජ පාරිභෝගිකයින්ට අඩු මිලට ලබා දෙන ලදී. | |
| (iv.) ආනයනික නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් සමහර පාරිභෝගිකයන් වෙත LPG සැපයුම් කර ඇත (එය USD 51 ක ප්‍රතිදාන ගාස්තුව (throughput fee) බැහැර කර ඇත). LPG තොග පාරිභෝගිකයින්ට පමණක් සැපයීමේදී සමාලෝචිත වර්ෂය සඳහා මුළු දළ අලාභය (ආනයනික නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිල USD 51 ප්‍රතිදාන ගාස්තුව (throughput fee) හැර) රුපියල් මිලියන 77 කි. | තරඟකරු පරිමාව ලබා ගැනීම සඳහා කුඩා ආන්තිකයක් හෝ ආන්තිකයක් නොමැතිව ඉතා අඩු මිල ගණන් යටතේ ඉදිරිපත් කර ඇත. GP ආන්තිකය බල නොපාන නමුත්, ප්‍රතිදානය (throughput) US$ 51 (සාමාන්‍ය ප්‍රතිදානය US$ 20) ලෙස අය කෙරේ. මෙම ඇමෙරිකානු ඩොලර් 31 යනු සෘජුවම ආන්තිකයයි. | |
| (v.)සමාලෝචිත වර්ෂය සඳහා වට්ටම් ලබා දී ඇති වාණිජ පාරිභෝගික මාස 6,695 අතුරින් වාණිජ පාරිභෝගික මාස 1,597 ට අදාළව කිලෝග්‍රෑමයකට දළ අලාභ පරාසය (ඇමරිකානු ඩොලර් 51 ක ප්‍රතිදාන ගාස්තුව | | |

ඇතුළත් නොවූ ආනයනික නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවෙන් මිල තීරණය කිරීම) රු. 10.64 සිට රු. 45.31 දක්වා විය.

(vi.)ඇතැම් අවස්ථාවලදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් මිලදී ගත් LP ගෑස් හි සත්‍ය මිලදී ගැනීමේ පිරිවැයට වඩා අඩුවෙන් LP ගෑස් තොග වශයෙන් සැපයීම සිදු කර ඇති බව නිරීක්ෂණය විය.

2021 අප්‍රේල් මාසයේ සිට තොග පිරිවැය සහ මිල සැකසීම සඳහා සලකා බලා ඇත්තේ ආනයනික නිෂ්පාදන පිරිවැය පමණි. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ CPC වෙතින් අසමාන සැපයුම සහ සැපයුම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස කුඩා වීමයි. ආනයන පිරිවැය CPC මිලදී ගැනීමේ පිරිවැයට වඩා වැඩි වන අතර පිරිවැය සඳහා ආනයන පිරිවැය ගැනීම සැමවිටම ආරක්ෂිත වේ. විනිමය අනුපාතිකය, PAL සහ භාණ්ඩ ප්‍රවාහන පිරිවැය හේතුවෙන් සැම විටම කිලෝග්‍රැමයකට CPC පිරිවැය කිලෝග්‍රැමයකට ආනයනික පිරිවැයට වඩා අඩුය.

(vii.)2020 දී ගනුදෙනුකරුවන් තිදෙනෙකුට නොමිලේ උපකරණ සැපයීමට අමතරව, පොදු කාර්ය පිරිවැය ආවරණය කිරීම සඳහා කිසිදු ආන්තිකයකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා ආනයනික නිෂ්පාදන පිරිවැයට ශුද්ධ වට්ටම් ලබාදී තිබුණි.

පාරිභෝගිකයින්ගේ වැදගත්කම මත තරඟකරුට වඩා ප්‍රතිලාභ ලබා දීම සඳහා බොහෝ මෙවලම් භාවිතා කර ඇත. ලිට්‍රෝ සමාගමට මෙට්‍රික් ටොන් 1300 ක පමණ අමතර පරිමාවක් ලැබී ඇති අතර එය මෙට්‍රික් ටොන් 2500 කට වඩා වැඩි ප්‍රමාණයක් ඩොලර් 15 ක් ලෙස ගත් බැවින් ටර්මිනල් සඳහා වර්ධක ආදායමක් ඇති වූ අතර සමාගම් දෙකේ ඒකාබද්ධ ආන්තිකය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළේය.

(ආ.)සමාලෝචිත වර්ෂය සඳහා ආනයනය හරහා LPG සැපයීම.

(i.) සමාගම විසින් සලකනු ලබන LPG හි උපරිම වාෂ්ප පීඩනය @ 37.8 Deg.C 830 kpa (බාර් 8.3) වන අතර , SLS 712 අනුව LPG හි උපරිම වාෂ්ප පීඩනය @ 37.8 Deg.C (1430 kpa) වේ. තවද, 2020 සහ 2021 වසර තුළ ගොඩබෑම් වරායේ LPG හි තත්ත්ව වාර්තා විශ්ලේෂණය කිරීමේදී, LPG සංයුතියේ අඩංගු ප්‍රොපේන් ප්‍රතිශතය සියයට 30 ට වඩා වැඩි වූ විට වාෂ්ප පීඩනය, LPG හි 37.8 Deg.C අගය 600 kpa (6 bar) ට වඩා වැඩි බව නිරීක්ෂණය

ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් විසින් ආනයනය කර බෙදා හරින ලද සියලුම නියාමකයින් (regulators) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය SLS 712:1998 විසින් නිකුත් කරන ලද LPG ප්‍රමිතීන්ට අනුව නියම කර ඇති උපරිම පීඩන සීමාවට අනුකූල වේ. ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් විසින් බාර් 6ක ආදාන පීඩන ශ්‍රේණිගත කිරීමක් සහිත කිසිදු නියාමකයක් (regulators) ආනයනය හෝ බෙදා හැරීම සිදු නොකරයි. ලිට්‍රෝ ගෑස් ලංකා විසින් බෙදා හරිනු ලබන නියාමකයන්ගේ

LPG වෙළඳපොළට සහ පාරිභෝගිකයින්ට හානි කිරීමට විවිධ මූලාශ්‍රවලින් පැන නගින අවදානම් හඳුනා ගැනීමට සමාගමට ක්‍රියා පටිපාටියක් තිබිය යුතු අතර පාරිභෝගිකයින්ට සහ කර්මාන්තයට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම

| | | |
|---|---|---|
| විය. | ආදාන පීඩන අගය සැම විටම බාර් 14 කි.<br><br>ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම විසින් ආනයනය කර බෙදා හරින ලද LPG වායුවේ වාෂ්ප පීඩනය සැම විටම 420-830 අතර පවතී උපරිම kpa @ 37.8 Deg.C. 2010 සිට සහ SLS 712:1998 LPG ප්‍රමිතියේ සඳහන් පිරිවිතර නිර්ණායකවලට අනුකූල වේ. | සඳහා දැනුවත් නියාමන බලධාරීන් සිටිය යුතුය. |
| (ii.)පැටවීමේ වරායේ ප්‍රමාණ සහතිකයට අනුව, එක් නැව්ගත කිරීමකදී LPG සංයුතිය නියමිත පිරිවිතර සපුරා නොමැති බව නිරීක්ෂණය විය. (ප්‍රොපේන්, සියයට 25 සිට සියයට 40 දක්වා සහ බියුටේන් සියයට 60 සිට සියයට 75 දක්වා පරාසයක බර ප්‍රතිශතය අනුව පවතී). 2021 මැයි 17 වන දින මුදා හරින ලද ඉහත කී නැව්ගත කිරීමේ දී ගෝල දෙකෙහි LPG සංයුතිය පිළිවෙළින් ප්‍රොපේන්, සියයට 85.62 ක් සහ බියුටේන්, සියයට 14.38 (මෙට්‍රික් ටොන් 1,669.404) සහ ප්‍රොපේන්, සියයට 8.76 සහ බියුටේන්, සියයට 91.24 (මෙට්‍රික් ටොන් 2,007.181 ) වේ.<br><br>- 2021 අප්‍රේල් 29 වන දින LGTLL හි අධ්‍යක්ෂ විසින් කරන ලද ඉල්ලීම මත ඉහත නැව්ගත කිරීම සිදු කරන ලදී. අමාත්‍ය මණ්ඩලයේ කිසියම් අනුමැතියක් (LPG ප්‍රසම්පාදනය කරනු ලබන්නේ ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව හරහා වන අතර අමාත්‍ය මණ්ඩලය විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම අනුමත කරයි.) සහ LPG හි පිරිවිතර සැලකිය යුතු ලෙස වෙනස් වුව ද එවැනි LPG සංයෝජනයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අනුමැතිය ලබා ගෙන නොමැත. ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම (LGTLL) හි අධ්‍යක්ෂවරයා විසින් ලබා දී ඇති ලිඛිත ප්‍රකාශය අනුව සමාගමේ සභාපතිවරයාගේ සහ මෙහෙයුම් අධ්‍යක්ෂවරයාගේ වාචික උපදෙස් මත එම ඉල්ලීම කරන ලදී.<br><br>- එම නැව්ගත කිරීම මගින් ආනයනය කරන ලද LPG කෙරවලපිටිය ප්‍රදේශයේ ගෝල (Sphere) 4 කට පුරවා 2021 මැයි 17 වන දින ගෝලවල (Sphere) අඩංගු ඉතිරි LPG සමඟ | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | ආනයනය ප්‍රමිතියේ සහ ගිවිසුමේ දක්වා ඇති LPG නිෂ්පාදන පිරිවිතරයන්ට අනුකූල වන බවට සමාගම සහතික විය යුතු අතර පිරිවිතරය තුළ ඇති භාණ්ඩය පමණක් පිළිගත යුතුය. |

මිශ්‍ර කරන ලදී. LPG මිශ්‍ර කිරීමෙන් පසු, A සහ D ගෝලයන් (Sphere) හි අඩංගු LPG වල ගුණාත්මක භාවය ස්වාධීන පරීක්ෂක විසින් 2021 මැයි 17 සහ 18 යන දිනයන්හිදී පරීක්ෂා කර ඇත. කෙසේ වෙතත්, ගෝල (Sphere) D හි අඩංගු LPG සංයුතිය, නියමිත පිරිවිතර තුළ නොතිබුණි (ප්‍රොපේන්, සියයට 14.17 සහ බියුටේන්, සියයට 84.91).

- Sphere B සහ C හි අඩංගු LPG වල ගුණාත්මකභාවය ස්වාධීන පරීක්ෂක විසින් පරීක්ෂා කර නොතිබුණි. Sphere B හි අඩංගු LPG පරීක්ෂා කිරීමකින් තොරව , Sphere B හි අඩංගු LPG මෙට්‍රික් ටොන් 1743.432 බවුසර් සහ පිරවුම් කම්හල වෙත 2021 මැයි 17, 18 සහ 19 යන දිනවල නිකුත් කර ඇත. පසුව, 2021 මැයි 19 වන දින ආනයනය කරන ලද LPG ගෝල 04ට පුරවා ගෝලවල අඩංගු LPG ශේෂ සමඟ මිශ්‍ර කරන ලදී.

- 2021 මැයි 19 වන දින ලබා දුන් LPG B සහ C ගෝල (Sphere) වලට මිශ්‍ර කිරීමෙන් පසු, 2021 මැයි 17 සිට LPG (LPG සංයුතිය ඇතුළුව) වල ගුණාත්මක භාවය මනිනු නොලැබූ නිසා B සහ C ගෝලහි (Sphere) අඩංගු LPG වල ගුණාත්මකභාවය පරීක්ෂා කළ යුතුය. කෙසේ වෙතත්, 2021 මැයි 20 වන දින පැය 06.00 වන විට B සහ C ගෝලහි (Sphere) අඩංගු LPG වල ගුණාත්මකභාවය ස්වාධීන පරීක්ෂක විසින් පරීක්ෂා කර නොතිබුණි.

- 2021 මැයි 17 සිට මේ දක්වා LPG පුරවන ලද B සහ C ගෝලයන්හි අඩංගු LPG භාවිතයෙන් නිෂ්පාදිත 2.3 Kg, 5 Kg, 18 ලීටර්, 12.5 Kg සහ 37.5 Kg ගෑස් සිලින්ඩරවල අඩංගු LPG වල (LPG සංයුතිය ඇතුළුව) ගුණාත්මකභාවය 2021 මැයි 17 වැනි දින සැලකිය යුතු මට්ටමකට අඩු වී තිබුණි, මැන නොතිබුණි.

- LPG සංයුතිය නියමිත පිරිවිතර සපුරා නොමැති ඉහත නැව්ගත කිරීම සඳහා ගෙවීම් කිරීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍ය අනුමැතිය මූල්‍ය අංශය විසින් ලබාගෙන නොතිබුණි.

| | | |
|---|---|---|
| (iii.)සමාලෝචිත වර්ෂය තුළ ආනයනය කරන ලද නෞභාර පත්‍ර 31 ට අදාළ ගොඩබෑම් වරායේ තත්ත්ව වාර්තාවේ දක්වා ඇති LPG සංයුතිය සහ පැටවුම් වරායේහි ප්‍රමාණ සහතිකයේ දක්වා ඇති LPG සංයුතිය අතර සැලකිය යුතු වෙනස්කම් ඇති බව පරීක්ෂණ මගින් අනාවරණය විය. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ගොඩබෑම් වරායේ LPG සංයුතිය භාවිතා කිරීම වෙනුවට සැපයුම්කරුට ගෙවීම් සිදු කිරිමේ දි පැටවුම් වරායේ LPG ප්‍රමාණයේ අඩංගු ප්‍රොපේන් සහ බියුටේන් ප්‍රතිශතය මත පදනම්ව පැටවුම් වරායේහි ස්වාධීන පරීක්ෂක විසින් ඉදිරිපත් කරන ලද ප්‍රමාණ සහතිකය මත පදනම්ව නිශ්චිත නැව්ගත කිරීම සඳහා මෙට්‍රික් ටොන් එකකට කොන්ත්‍රත් මිල සඳහා ගෙවීම් සිදු කර ඇත. | නිෂ්පාදනයේ ස්වභාවය, නියැදීමේ ක්‍රමය, භාවිතා කරන උපකරණය, උපකරණ ක්‍රමාංකනය කිරීම සහ මානව නිපුණතා හේතුවෙන් පැටවුම් වරායේ සහ ගොඩබෑම් වරායේ පරීක්ෂණ ප්‍රතිඵලය සැලකිය යුතු වෙනසක් ඇති කළ හැකි බව තෙල් හා ගෑස් කර්මාන්තයේ ගෝලීය වශයෙන් පිළිගත් සංසිද්ධි වේ.සියලුම තෙල් සහ ගෑස් කොන්ත්‍රාත්තුව තෝරාගත් සැපයුම් නියමයන් මත පදනම්ව පැටවීමට හෝ විසර්ජන වරාය ප්‍රතිඵලවලට බැඳීමක් ඇති කරන්නේ එබැවිනි.සීමාසහිත ජාත්‍යන්තර ගෑස් ටැංකි සහ පර්යන්ත මෙහෙයුම් සංගමය විසින් "ද්‍රව වායුව හැසිරවීමේ මූලධර්ම" ප්‍රකාශනය තුළ මෙය ඉතා හොඳින් තහවුරු වී ඇත. | පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සැපයුම් ගිවිසුමේ සහ ප්‍රමිතීන්හි නිශ්චිතව දක්වා ඇති පරාසය තුළ නිෂ්පාදනවල ගුණාත්මකභාවය සමාගම සහතික කළ යුතුය. |
| (iv.)ගොඩබෑම් වරායේ තත්ත්ව වාර්තාවට අනුව ඉහත නෞභාර පත්‍ර 31 න් නෞභාර පත්‍ර 06 කට අදාළ LPG සංයුතිය නියමිත පිරිවිතරයන්ට අදාලව නොතිබුණි. | සියලුම නැව්ගත කිරීම් 420-830 kpa පීඩන පරාසයක් තුළ වන අතර SLS 712:1988 අවශ්‍යතාවයට අනුකූල වේ. | |
| (v.)ගොඩබෑම් වරායේ තත්ත්ව වාර්තාවට අමතරව 2020 ජනවාරි 29 වැනි දින වෙනත් ස්වාධීන පරීක්ෂකවරයකුගෙන් නෞභාර පත්‍ර දෙකට අදාළ LPG පිළිබඳ තත්ත්ව වාර්තාව ලබාගෙන ඇත. වාර්තාවට අනුව, ප්‍රොපේන් බර ප්‍රතිශතය සියයට 22.39 ක් වූ අතර, පැටවුම් වරායේ තත්ත්ව වාර්තාවේ දක්වා ඇති ප්‍රොපේන් ප්‍රතිශතය සමඟ සියයට 9.91 ක වෙනසක් තිබුණි. | නිෂ්පාදනයේ ස්වභාවය, නියැදීමේ ක්‍රමය, භාවිතා කරන උපකරණය, උපකරණවල ක්‍රමාංකනය සහ මානව නිපුණතා හේතුවෙන් පැටවුම් වරායේ සහ ගොඩබෑම් වරායේ පරීක්ෂණ ප්‍රතිඵලය සැලකිය යුතු වෙනසක් ඇති කළ හැකි බව තෙල් හා ගෑස් කර්මාන්තයේ ගෝලීය වශයෙන් පිළිගත් සංසිද්ධි වේ. සියලුම තෙල් සහ ගෑස් කොන්ත්‍රාත්තු තෝරාගත් සැපයුම් නියමයන් මත පදනම්ව පැටවීමට හෝ විසර්ජන වරාය ප්‍රතිඵලවලට බැඳීමක් ඇති කරන්නේ එබැවිනි. ජාත්‍යන්තර ගෑස් ටැංකි සහ පර්යන්ත මෙහෙයුම් සංගමය විසින් "ද්‍රව වායුව හැසිරවීමේ මූලධර්ම" ප්‍රකාශනය තුළ මෙය ඉතා හොඳින් තහවුරු වී ඇත. | |
| (vi.)පැටවුම් වරායෙහි ප්‍රමාණ සහතිකයේ දක්වා ඇති LPG සංයුතිය සහ ගොඩබෑම් වරායේ තත්ත්ව වාර්තාවේ දක්වා ඇති LPG සංයුතිය අතර සැලකිය යුතු වෙනස්කම් පැවතීම පිළිබඳව විගණනයට ප්‍රශ්න මතු විය.තවද, නැවක LPG පිරවූ ගෝල දෙකක් තිබුණද, නැවේ අඩංගු LPG | විභව වෙනස අවම කිරීම සඳහා පැටවුම් වරායේ වාර්තා දෙකක් ඉල්ලා සිටීමට අපි කටයුතු කරන්නෙමු. | |

| | | |
|---|---|---|
| වල ප්‍රමිතිය එකවර පැටවුම් වරායේ දි පරීක්ෂා කර ඇත (එකම තත්ත්ව වාර්තාවක් පමණක් තිබූ බැවින්). කෙසේ වෙතත්, නෞකාවේ සෑම ගෝලයකම අඩංගු LPG වල ගුණාත්මකභාවය ගොඩබෑම් වරායේදී පරීක්ෂා කර ඇත. (ගෝල 1 සහ 2 සඳහා වෙනම තත්ත්ව වාර්තාවක් තිබූ බැවින්). | | |
| (vii.)ගොඩබෑම් වරායේ LPG හි තත්ත්ව වාර්තා ප්‍රසම්පාදන අංශය සහ මූල්‍ය අංශය යන දෙකෙන්ම ලේඛනගත කර නොතිබූ අතර එය ලේඛනගත කර ඇත්තේ LGTLL විසින් පමණි. ප්‍රසම්පාදන අංශය විසින් LPG ප්‍රසම්පාදනයේ සියලුම ක්‍රියාකාරකම් සිදු කරනු ලැබුවද, බෙදා හරින ලද LPG සැපයුම් ගිවිසුමේ සියලුම කොන්දේසි සහ අවශ්‍යතා සපුරාලන්නේ දැයි පරීක්ෂා කර නොතිබුණද එය ප්‍රසම්පාදන ප්‍රධානියාගේ රැකියා විස්තරයට අනුව ඔහුගේ රාජකාරියක් විය. අනෙක් අතට, සැපයුම් ගිවිසුමේ සියලුම කොන්දේසි සහ අවශ්‍යතා සමඟ බෙදා හරින ලද LPG අනුකූල වීම LPG ගෙවීම අනුමත කිරීම සඳහා අනිවාර්ය අවශ්‍යතාවයකි. කෙසේ වෙතත්, ගොඩබෑම් වරායේ LPG හි තත්ත්ව වාර්තා ගෙවීම අනුමත කිරීම සඳහා මූල්‍ය අංශය විසින් සලකා බලා හෝ ලේඛනගත කර නොතිබුණි. | මූල්‍ය අංශයට තත්ත්ව වාර්තා කියවීමට තාක්ෂණිකව සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් නොමැති අතර නිෂ්පාදනයේ ගුණාත්මකභාවය මැනීමට වගකියනු නොලැබෙන අතර LGTLL තෙවන පාර්ශ්ව පරීක්ෂකගේ සහාය ඇතිව නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීමෙන් පසු පිළිගැනීමේ කටයුතු සිදු කරයි. තත්ත්ව පරීක්ෂාව, ඇණවුම් භාර ගැනීම සහ LPG නැව්ගත කිරීම්වලට අදාළ ඕනෑම අනුමැතියක් LGTLL හි වගකීමක් වන අතර මුදල් අංශය විසින් ගෙවීම් සිදු කරනු ලබන්නේ ගෙවීම් දිනට පෙර සිදු වූ පිළිගත් සහ මුදා හරින ලද LPG නැව්ගත කිරීම් සඳහා පමණි. | LPG හි ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලනයක් ලෙස අවශ්‍ය පිරිවිතරයන් සපුරා ඇති බව සහතික කිරීම සඳහා මුදල් ගෙවීමට පෙර තත්ත්ව වාර්තාව කියවා තේරුම් ගැනීමට මූල්‍ය වෘත්තිකයන්ට හැකි විය යුතුය. |
| (viii.) ආනයනය කරන ලද LPG හි පිරිවිතරයන්ට අනුව, LPG හි අඩංගු සුවඳ (Ethylmercaptan) මෙට්‍රික් ටොන් 1000කට ලීටර් 26ක් විය යුතුය. කෙසේ වෙතත්, එය සුවඳ පරීක්ෂාව හැර පැටවුම් වරායේ සහ ගොඩබෑම් වරායේ ස්වාධීන පරීක්ෂක විසින් මනිනු නොලබයි. භාවිතා කරන්නන්ට ගෑස් කාන්දු වීම දැනීම සහ ගෑස් කාන්දුවකදී සිදුවන අනතුරු වළක්වා ගැනීම සඳහා නැවත පිරවූ ගෑස් සිලින්ඩරවල ප්‍රමාණවත් දුර්ගන්ධයක් අඩංගු වී ඇති බව සහතික කර නොතිබුණි. | ඉහත සාන්ද්‍රණය ද්‍රව අවධියේදී නිවැරදිව සත්‍යාපනය කිරීමට පරීක්ෂණ ක්‍රමයක් නොමැති බැවින්, LPG ද්‍රව අවස්ථාවේ දී Odorant 14 PPM තිබීමේ SLS 712:1988 අවශ්‍යතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා LPG ද්‍රව මෙට්‍රික් ටොන් 1000කට ලීටර් 26ක් එකතු කිරීමට පිරිවිතර දක්වා ඇත. LPG, පරීක්ෂා කිරීමේ එකම ක්‍රමය වන්නේ පිරිවිතර වගුවේ පැහැදිලිව දක්වා ඇති "සුවඳ පරීක්ෂණය" වන අතර ඒ අනුව ගොඩබෑම් වරායේ නියැදි පරීක්ෂාවේදී සිදු කෙරේ. ගඳ සුවඳ පරීක්ෂා කිරීමට සහ ගොඩබෑම් සඳහා නැව්ගත කිරීම් අනුමත කිරීමට CAA, SLSI, ITI නියෝජනය කරන කාර්ය මණ්ඩල සාමාජිකයින් කණ්ඩායමක් යෙදවීමට බලධාරීන්ට මෑතකදී සිදු වූයේ එබැවිනි. | LPG වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා සුදුසු පරීක්ෂණ ක්‍රමයක් යෙදවීමෙන් සමාගම LPG භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සහතික කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ix.)සෑම මසකම කොන්ත්‍රත් මිල (CP) ප්‍රකාශයට පත් කරනු ලබන්නේ පෙර මාසයේ අවසාන දිනයේ හෝ වත්මන් මාසයේ 01 වන දින ය.MT එකකට Propane සහ Butane සඳහා නාමයෝජනා දුන් මාසයේ CP හි සැලකිය යුතු උච්චාවචනයන් ඇති වේ. ඉහත CP උච්චාවචනයන්ට අනුව, පහත සඳහන් හේතූන් නිසා අඩු මිල අවස්ථා වලදී පිරිවැය ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාව සහ ඉහළ මිල ගණන්වලදී පිරිවැය වැඩිවීම් අවම කර ගැනීමේ අවස්ථාව සමාගමට සීමා වී ඇති බව නිරීක්ෂණය විය.<br><br>• 2020 සහ 2021 වසර සඳහා ඉල්ලුම පුරෝකථනයෙන් සියයට 99 ක් පමණ (මෙට්‍රික් ටොන් 740,000 සිට +/- සියයට 10 ට යටත්ව) මෙම ප්‍රසම්පාදනය හරහා සැපයීමට එකඟ විය. එවිට, සුදුසු රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් ප්‍රසම්පාදනය කරනු ලබන හදිසි මිලදී ගැනීම් හරහා අඩු මිලක් ලබා ගැනීමේ අවස්ථාව සීමා වේ.<br><br>• ගිවිසුමේ 12 වැනි වගන්තිය අනුව, වත්මන් මාසයේ 10 වැනි දින හෝ ඊට පෙර, සමාගම විසින් ඉදිරි මාසය සඳහා ඔවුන්ගේ අවශ්‍යා පරිමාව ඉදිරිපත් /නම් කළ යුතුය. ඒ වන විට, ඊළඟ මාසය සඳහා CP ප්‍රකාශයට පත් කර නොමැත (එය වත්මන් මාසයේ අවසාන දිනයේ හෝ ලබන මාසයේ 1 දින ප්‍රකාශයට පත් කෙරේ.). එබැවින් අඩු මිල තත්ත්වයකදී වැඩි ප්‍රමාණයක් නම් කිරීමටත් වැඩි මිලක් ඇති අවස්ථාවක අඩු ප්‍රමාණයක් නම් කිරීමටත් ඇති අවස්ථාව සමාගමට සීමා වේ. | ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය නිෂ්පාදනයන්ගෙන් LPG එකකි සහ ශ්‍රී ලංකාවේ LPG වෙළඳපොළට අවශ්‍ය සැපයුම දිගටම සැපයීම කරගෙන යන්න. පහත දක්වා ඇති සමාගමේ සීමාවන් සැලකිල්ලට ගනිමින්, SPOT මිලදී ගැනීම වෙනුවට වසර 1ක හෝ 2ක කොන්ත්‍රාත් ගිවිසුමක් සමඟ ඉදිරියට යාමට කළමනාකරණය තීරණය කරයි.<br><br>• ගබඩා පහසුකම් හැකියාව 8,000 MT + 3,000 MT, කෙසේ වෙතත්, ඉල්ලුම සපුරාලීම සඳහා දෛනිකව 1,000-1,200 MT අවශ්‍ය වේ.<br>• අඛණ්ඩ සැපයුමක් සමඟ මෙහෙයුම් කිරීම සඳහා, කැපවූ සමාගමක්, යාත්‍රා සහ මෙහෙයුම් සැලැස්ම කාල සීමාව පුරාවට තැබිය යුතුය.<br><br>• අඩු ගබඩා පහසුකම් හේතුවෙන් නාමයෝජනා සමඟ සැලකිය යුතු ප්‍රයෝජන ගැනීමට නොහැකි වීම. තවද කර්මාන්තයේ සම්මතයක් ලෙස, සැපයුම් විධිවිධාන සැලසුම් කිරීම සඳහා ගැනුම්කරු මාසයකට පෙර සැපයුම්කරුට අවශ්‍යතාවය ලබා දිය යුතුය.<br><br>යෝජිත සැලසුම් / උපාය මාර්ග පෙළ<br><br>• විශාල යාත්‍රා සඳහා CBM පහසුකම SPBM වෙත පුළුල් කිරීම.<br><br>ගබඩා පහසුකම මෙ.ටොන් 3000 බැගින් වූ ගෝල දෙකකට වර්ධනය කිරීමට. | මිල උච්චාවචනයන් වලදී රටට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සමාගම ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි වල වඩා නම්‍යශීලී බවක් ඇතුළත් කළ යුතුය. |
| • සමාගමට සීමිත ගබඩා පහසුකම් ඇත. කෙරවලපිටිය, මාබිම සහ හම්බන්තොට ගබඩා පහසුකම් පිළිවෙලින් මෙ.ටොන් 8,000, මෙ.ටොන් 424 සහ මෙ.ටොන් 2,700 කි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, LPG ඉදිරි වක්‍ර (Forward Curves) හි අඩු මිල තත්ත්වය තුළ වැඩි ප්‍රමාණයක් නම් කිරීමට ඇති අවස්ථාව සීමා වී ඇත. | ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය නිෂ්පාදනයන්ගෙන් LPG එකකි සහ ශ්‍රී ලංකාවේ LPG වෙළඳපොළට අවශ්‍ය සැපයුම දිගටම සැපයීම කරගෙන යන්න. පහත දක්වා ඇති සමාගමේ සීමාවන් සැලකිල්ලට ගනිමින්, SPOT මිලදී ගැනීම වෙනුවට වසර 1ක හෝ 2ක කොන්ත්‍රාත් ගිවිසුමක් සමඟ ඉදිරියට | ආනයන පිරිවැය අඩු කිරීමට සහ අවසාන පාරිභෝගිකයින්ට හැකි අඩුම මිලට LPG සැපයීමට සමාගමට නිසි උපාය මාර්ගික සැලසුම් තිබිය යුතුය. |

| | | |
|---|---|---|
| • කෙරවලපිටියේ CBM පහසුකමෙහි උපරිම අවසර ලත් නැව් ධාරිතාව 20,000 M3 (සාමාන්‍ය නැවක ප්‍රමාණය MT 2,500 MT සිට 4,000 MT අතර වේ) සහ මසකට නැංගුරම් ශාලා 07 ක් සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වේ. එබැවින් මසකට ආනයනය කළ හැකි ප්‍රමාණය සීමිතය. | යාමට කළමනාකරණය තීරණය කරයි.<br><br>• ගබඩා පහසුකම් හැකියාව 8,000 MT + 3,000 MT, කෙසේ වෙතත්, ඉල්ලුම සපුරාලීම සඳහා දෛනිකව 1,000-1,200 MT අවශ්‍ය වේ.<br>• අඛණ්ඩ සැපයුමක් සමඟ මෙහෙයුම් කිරීම සඳහා, කැපවූ සමාගමක්, යාත්‍රා සහ මෙහෙයුම් සැලැස්ම කාල සීමාව පුරාවට තැබිය යුතුය.<br>• අඩු ගබඩා පහසුකම් හේතුවෙන් නාමයෝජනා සමඟ සැලකිය යුතු ප්‍රයෝජන ගැනීමට නොහැකි වීම. තවද කර්මාන්තයේ සම්මතයක් ලෙස, සැපයුම් විධිවිධාන සැලසුම් කිරීම සඳහා ගැනුම්කරු මාසයකට පෙර සැපයුම්කරුට අවශ්‍යතාවය ලබා දිය යුතුය.<br><br>යෝජිත සැලසුම් / උපාය මාර්ග පෙළ<br><br>• විශාල යාත්‍රා සඳහා CBM පහසුකම SPBM වෙත පුළුල් කිරීම.<br><br>ගබඩා පහසුකම මෙ.ටොන් 3000 බැගින් වූ ගෝල දෙකකට වර්ධනය කිරීමට. | |
| (x.) 2020 සහ 2021 වසර තුළ අඩුම කොන්ත්‍රාත් මිල (CP) ප්‍රොපේන් සඳහා USD 230 ක් සහ බියුටේන් සඳහා USD 240 ක් 2020 අප්‍රේල් මාසයේදී වූ අතර 2020 අප්‍රේල් සඳහා නම් කළ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 26,000 කි. 2021 නොවැම්බර් මාසයේදී ප්‍රොපේන් සඳහා USD 870 ක් සහ බියුටේන් සඳහා USD 830 ඉහළම CP මිලක් වූ අතර 2021 නොවැම්බර් සඳහා නම් කළ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 33,000 කි. එබැවින් අඩු මිල ගණන්වලදී පිරිවැය ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාව සහ ඉහළ මිල ගණන්වලදී පිරිවැය වැඩිවීම් අවම කර ගැනීමේ අවස්ථාව සමාගමට ලැබී නොතිබුණි. | ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය නිෂ්පාදනයන්ගෙන් LPG එකකි සහ ශ්‍රී ලංකාවේ LPG වෙළඳපොළට අවශ්‍ය සැපයුම දිගටම සැපයීම කරගෙන යන්න. පහත දක්වා ඇති සමාගමේ සීමාවන් සැලකිල්ලට ගනිමින්, SPOT මිලදී ගැනීම වෙනුවට වසර 1ක හෝ 2ක කොන්ත්‍රාත් ගිවිසුමක් සමඟ ඉදිරියට යාමට කළමනාකරණය තීරණය කරයි.<br><br>• ගබඩා පහසුකම් හැකියාව 8,000 MT + 3,000 MT, කෙසේ වෙතත්, ඉල්ලුම සපුරාලීම සඳහා දෛනිකව 1,000-1,200 MT අවශ්‍ය වේ.<br>• අඛණ්ඩ සැපයුමක් සමඟ මෙහෙයුම් කිරීම සඳහා, කැපවූ සමාගමක්, යාත්‍රා සහ මෙහෙයුම් සැලැස්ම | අඩු මිලක් ඇති අවස්ථාවකදී වැඩි ප්‍රමාණයක් නම් කිරීමෙන් වෙළඳපොලේ මිල උච්චාවචනයන්ගේ ප්‍රතිලාභ ලබා ගැනීමට සමාගම කාලෝචිත තීරණ ගත යුතුය. |

| | | |
|---|---|---|
| | කාල සීමාව පුරාවට තැබිය යුතුය.<br>• අඩු ගබඩා පහසුකම් හේතුවෙන් නාමයෝජනා සමඟ සැලකිය යුතු ප්‍රයෝජන ගැනීමට නොහැකි වීම. තවද කර්මාන්තයේ සම්මතයක් ලෙස, සැපයුම් විධිවිධාන සැලසුම් කිරීම සඳහා ගැනුම්කරු මාසයකට පෙර සැපයුම්කරුට අවශ්‍යතාවය ලබා දිය යුතුය.<br><br>යෝජිත සැලසුම් / උපාය මාර්ග පෙළ<br><br>• විශාල යාත්‍රා සඳහා CBM පහසුකම SPBM වෙත පුළුල් කිරීම.<br><br>ගබඩා පහසුකම මෙ.ටොන් 3000 බැගින් වූ ගෝල දෙකකට වර්ධනය කිරීමට. | |
| (xi.) සැපයුම්කරු සමඟ ඇති කර ගත් ගිවිසුමේ 1.4 වගන්තියට අනුව, මාසික නාමයෝජනා සමඟ හෝ වෙනත් විශේෂ අවශ්‍යතාවයක් සඳහා ගැණුම්කරු විසින් ප්‍රොපේන් සහ බියුටේන්වල සුදුසු සංයෝජනය නියම කරනු ඇත. කෙසේ වෙතත්, මෙම විධිවිධානය කොන්ත්‍රාත් මිල වැඩිය වාර්තා වූ මාස තුල දී පවා සමාගම විසින් භාවිතා කර නොතිබූ අතර LPG පිරිවැය අවම කිරීම සඳහා ප්‍රොපේන් සඳහා කොන්ත්‍රාත් මිල බියුටේන් සඳහා කොන්ත්‍රාත් මිල වලට වඩා වැඩි විය. උදාහරණයක් ලෙස, 2021 නොවැම්බර් සඳහා මාසික නාමයෝජනා ප්‍රොපේන් වෙතින් සියයට 30ක් සහ බියුටේන් සියයට 70ක් සමඟින් සඳහන් කර තිබුණේ නම් ඩොලර් 74,938.51ක මුදලක් අඩු කළ හැකිව තිබුණි. | ගිවිසුමේ 1.4 වගන්තියේ විධිවිධාන යටතේ, ගැණුම්කරු අදහස් කරන්නේ ප්‍රොපේන් සහ බියුටේන් වල සුදුසු සංයෝගයක් සඳහන් කිරීමට පමණක් බව කරුණාවෙන් සලකන්න, එය ඇමුණුම් 1 හි දක්වා ඇති පිරිවිතරයෙන් ඔබ්බට නිෂ්පාදනයේ විශේෂ අවශ්‍යතාවයක් ඇති විට පමණි. එනම් සාමාන්‍ය නිෂ්පාදන පිරිවිතර පත්‍රය. සාමාන්‍ය මාසික නාමයෝජනා සඳහා මෙය අදාළ නොවේ, මන්ද අපි නිෂ්පාදිතය එකම පිරිවිතරය තුළ ඇණවුම් කරන්නේමු. | ගිවිසුමේ නිශ්චිත සීමාවන් තුළ සුදුසු සංයෝජනයක් නම් කිරීමෙන් ආනයන පිරිවැය අඩු කිරීමේ හැකියාව සමාගම සෙවිය යුතුය. |

(ඇ.) ලීටර් 18 සුපිරි දෙමුහුන් LP ගෑස් සිලින්ඩරය බෙදා හැරීම

| | | |
|---|---|---|
| (i.) සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සමාගමේ සභාපතිවරයා විසින් යවන ලද 2021 අප්‍රේල් 28 දිනැති ලිපියේ සඳහන් කර ඇති ලීටර් 18 සුපිරි දෙමුහුන් ගෑස් සිලින්ඩරයේ LPG හි සංයුතිය (ප්‍රොපේන්, සියයට 40 සිට සියයට 50 දක්වා සහ බියුටේන්, සියයට 50 සිට සියයට 60 දක්වා වන අතර වාෂ්ප පීඩනය 105 psig, 724 kpa | ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් විසින් ආනයනය කර බෙදා හරින ලද සියලුම නියාමකයින් ( regulators ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය SLS 712:1998 විසින් නිකුත් කරන ලද LPG ප්‍රමිතීන්ට අනුව උපරිම පීඩන සීමාවට (1430 psi) අනුකූල වේ. Litro Gas lanka Ltd 6 බාර් ආදාන පීඩන ශ්‍රේණිගත කිරීමක් සහිත කිසිදු | LPG සහ අදාළ උපාංග අදාළ බලධාරීන් විසින් නිශ්චිතව දක්වා ඇති පිරිවිතරයන් තුළ ඇති බවට සමාගම සහතික විය යුතු අතර ආරක්ෂාව සම්බන්ධ ගැටළු ඇති වුවහොත් අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කළ යුතුය. |

| | |
|---|---|
| @ 100F) 2010 සිට සමාගම විසින් සලකා බලන ලද සීමාවන් තුළ නොතිබුණු බව නිරීක්ෂණය විය. (බර ප්‍රතිශතය අනුව උපරිම සියයට 40 ප්‍රොපේන් සීමාවන් තුළ). ලිපියේ සඳහන් ලීටර් 18 සුපිරි දෙමුහුන් ගෑස් සිලින්ඩරයේ අඩංගු 100F 105 psig (724 kpa) වාෂ්ප පීඩනය 2010 සිට සමාගම විසින් සලකා බැලූ උපරිම වාෂ්ප පීඩනය තුළ වුවද, (උපරිම වාෂ්ප පීඩනය, LPG හි මානය @ 37.8 Deg.C 830 kpa වේ), එය වෙළඳපොලේ පවතින ඇතැම් ගෑස් නියාමකයන් (gas regulators) අවසර දී ඇති උපරිම ආදාන පීඩනය තුළ නොතිබුණි. (600 kpa -6 බාර්). | නියාමකයක් ආනයනය හෝ බෙදා හැරීම සිදු නොකරයි. Litro gas lanka විසින් බෙදා හරිනු ලබන නියාමකයන්ගේ ආදාන පීඩන අගය සෑම විටම බාර් 14 කි. Litro gas lanka විසින් ආනයනය කර බෙදාහරින LPG සෑම විටම වාෂ්ප පීඩනය 420-830 max.kpa @ 37.8deg.C අතර පවතී 2010 සිට සහ SLS 712:1998 LPG ප්‍රමිතියේ සඳහන් පිරිවිතර නිර්ණායකවලට අනුකූල වේ |
| (ii.) ලීටර් 18 සුපිරි දෙමුහුන් ගෑස් සිලින්ඩරයේ අඩංගු LPG සංයුතිය තීරණය කිරීමේදී වෙළඳපොලේ ඇති යම් ආකාරයක ගෑස් නියාමකයින් (600 kpa - 6 bar) මඟින් ලබා දෙන උපරිම ආදාන පීඩනය සලකා බැලූ බව නිරීක්ෂණය නොවිය. | අනෙකුත් ආනයනකරුවන් විසින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන LPG නියාමකයන්ගේ ගුණාත්මකභාවය/ පිරිවිතරයන් අධීක්ෂණය කිරීම සහ නියාමනය කිරීම Litro Gas Lanka Ltd හි පාලනයට යටත් නොවේ. මෙය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රමිතිගත කළ යුතු අතර ශ්‍රී ලංකා රේගු ආනයන පාලන දෙපාර්තමේන්තුව විසින් නියාමනය කළ යුතු වේ. Litro gas lanka Ltd 6bar ට අඩු ආදාන පීඩන ශ්‍රේණිගත කිරීම් සහිත නියාමක ආනයනය කර බෙදා හැරීම සිදු නොකරන බැවින්, එය අපට කිසිසේත්ම අදාළ නොවේ. 420-830 max kpa යනු Litro gas LPG පිරිවිතරය වන අතර එය Litro gas lanka Ltd විසින් ආනයනය කර බෙදාහරින ලද නියාමකයන්ගේ බාර් 14 ආදාන පීඩන ශ්‍රේණිගත කිරීමට වඩා බෙහෙවින් අඩු බව සලකන්න. |
| (iii.) ඉහත සඳහන් ලිපිය මගින් ලීටර් 18 සුපිරි දෙමුහුන් ගෑස් සිලින්ඩරය සඳහා නිශ්චිතව දක්වා ඇති LPG හි පිරිවිතරයන් නොතකා, 2021 අප්‍රේල් සිට 2021 ඔක්තෝබර් දක්වා කාලය තුළ ආනයනය කරන ලද LPG සංයුතිය (ලීටර් 18 ගෑස් සිලින්ඩරයක් | ෂෙල් පෙට්‍රෝලියම් වලින් අපට උරුම වූ ජාත්‍යන්තරව පිළිගත් මිශ්‍ර කිරීමේ මෙවලම් අතීතයේ බොහෝ වාරයක් දළ වශයෙන් අවසන් සංයුතිය ගණනය කිරීමට අපි අනුගමනය කල අතර මෙම සමාගම 2000 සිට 2010 දක්වා |

| | |
|---|---|
| -වෙළඳපොළට බෙදා හැරීමේ කාලය) 2021 මැයි 17 දින පැමිණි එක් නැව්ගත කිරීමක් හැර බර ප්‍රතිශතය අනුව අවම වශයෙන් සියයට 25 සිට උපරිම සියයට 40 දක්වා ප්‍රොපේන් සහා ඉතිරි සියයට 75 සිට සියයට 60 දක්වා බියුටේන් සීමාවන් තුළ තිබුණි. 2021 මැයි 17 වැනි දින සිට ඉහත කී ගෝලවලට පුරවන ලද LPG 2021 මැයි 17 සිට මේ දක්වා Sphere B සහ C හි අඩංගු LPG භාවිතයෙන් නිෂ්පාදනය කරන ලද LPG ලීටර් 18 ගෑස් සිලින්ඩරවල අඩංගු LPG (LPG සංයුතිය ඇතුළුව) වල ගුණාත්මකභාවය සැලකිය යුතු මට්ටමකට අඩු වී ඇති බව නිරීක්ෂණය වූ අතර, මනිනු ලැබුවේ නැත. | ඔවුන්ගේ හිමිකාරීත්වය යටතේ පැවතිණි. මෙම වාර්තාවේ 2.8.1 සිට 2.8.4 දක්වා සාකච්ඡා කර ඇති උදාහරණ වලින් ක්‍රියාවලියේ නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය හොඳින් ඔප්පු වී ඇත. එබැවින්, B සහ C ගෝලයේ අඩංගු නිෂ්පාදනයේ ගුණාත්මකභාවය එකම මිශ්‍ර කිරීමේ මෙවලම භාවිතයෙන් ගණනය කරන ලද අනුපාත මගින් සහතික විය. කෙසේ වෙතත්, ඉහත උපකල්පනය සත්‍යාපනය කිරීම සඳහා, අපි Geo Chem lanka pvt ltd වෙතින් නියැදි පරීක්ෂණය භාවිතා කරමින් මිශ්‍රණවල හයිඩ්‍රොකාබන් සංයුතිය ගණනය කිරීමේ ජාත්‍යන්තරව පිළිගත් සම්මතය අනුගමනය කරමින් B සහ C ගෝලයේ අවසාන මිශ්‍රණ සඳහා තත්ත්ව වාර්තා ඉල්ලා සිටියෙමු. පැටවුම් වරායේ සහ ගොඩබෑම් වරායේ පරීක්ෂණ පහත සඳහන් සියලුම පාර්සල් සඳහා අවශ්‍ය ප්‍රමාණයන් තුළ ඇති බැවින්, මූලික මිශ්‍ර කිරීමෙන් පසු පුනරාවර්තන පදනමින් සංයුතිය පරීක්ෂා කිරීමට ක්‍රියා පටිපාටියක් හෝ අවශ්‍යතාවයක් නොමැත. එබැවින්, වැඩිදුර පරීක්ෂණ අවශ්‍ය නොවේ. එබැවින්, B සහ C ගෝලයෙන් සිලින්ඩර පිරවීම සඳහා ගබඩා කර නිකුත් කරන ලද සියලුම නිෂ්පාදන අවශ්‍යතාවලට සම්පූර්ණයෙන්ම අනුකූල වේ. |

(ඈ) හිස් සිලින්ඩරවලට LPG පිරවීමේ ක්‍රියාවලිය

| | | | |
|---|---|---|---|
| (i.) | කෙරවලපිටියේ පිරවුම් කම්හලේ පිරවීමේ ක්‍රියාවලිය සඳහා වූ මෙහෙයුම් අත්පොතක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණන වාර්තාවේ පිළිතුරු සමඟ මෙහෙයුම් අත්පොත ඉදිරිපත් කර තිබුණි. | ඵලදායී විගණනයක් සහතික කිරීම සඳහා සමාගම විසින් ඉල්ලා සිටින තොරතුරු විගණනය අතරතුර ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii.) සිලින්ඩරවල අඩංගු LPG හි ප්‍රමිතිය පිළිබඳ කිසියම් ගැටලුවකදී ගෑස් සිලින්ඩර වෙළඳපොළෙන් ඉවත් කර ගැනීම සඳහා වෙළඳපොළට බෙදා හරින නැවත පිරවූ ගෑස් සිලින්ඩර සොයා ගැනීමට සමාගම විසින් කිසිදු හඳුනාගැනීමේ පද්ධතියක් හඳුන්වා දී නොතිබුණි. | ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව විසින් නව හැකිලීමේ මුද්‍රාවක් හඳුන්වා දීමට පියවර ගෙන ඇති අතර එහි පහළ කොටස කාණ්ඩ අංකයෙන් සලකුණු කර ඇති අතර එය ඊළඟ පිරවීම සඳහා පිරවුම් කම්හල වෙත නැවත පැමිණෙන තෙක් සිලින්ඩරය සමඟ පවතිනු ඇත. | පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම සඳහා සිලින්ඩරවල අඩංගු LPG වල ගුණාත්මක භාවය පිළිබඳ ඕනෑම ගැටළුවකදී ගෑස් සිලින්ඩර වෙළඳපොළෙන් ඉවත් කර ගැනීම සඳහා වෙළඳපොළට බෙදා හරින ලද නැවත පිරවූ ගෑස් සිලින්ඩර සොයා ගැනීමට සමාගම විසින් නිසි හඳුනාගැනීමේ පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |
| (i.) 2021 නොවැම්බර් මාසය දක්වා කෙරවලපිටිය පිරවුම්හලේ ගෑස් සිලින්ඩරයේ කපාටයෙන් (valve) ගෑස් කාන්දුවක් පිළිගත හැකි විද්‍යාත්මක ක්‍රමවේදයක් මගින් පරීක්ෂා කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.<br>(ii.) ගෑස් සිලින්ඩරයේ වාෂ්ප පීඩනය නියැදි පදනමින් 2021 නොවැම්බර් දක්වා පරීක්ෂා කර ඇති බව නිරීක්ෂණය නොවීය.<br>(ii.) ජල ස්නානය භාවිතයෙන් සිලින්ඩරයේ බඳෙහි ගෑස් කාන්දු වීම පරීක්ෂා කෙරේ.කෙසේ වෙතත්, සිලින්ඩරයේ බඳෙහි ගෑස් කාන්දුවක් ඇති සමහර අවස්ථා මානව දෝෂ හේතුවෙන් අනාවරණය කර ගත නොහැක. | මේ සඳහා ඉලෙක්ට්‍රොනික ගෑස් අනාවරකය (Detector) ක්‍රියාත්මක වේ. එය පිරියත නිෂ්පාදකයාගෙන් අපට ලැබුණු පිරවුම් පිරියත පැකේජයේ කොටසකි. මෙය 1999 ෂෙල් ගෑස් කාල පරිච්ඡේදයේ සිට භාවිතා කරන ලදී. කෙරවලපිටිය පිරවුම්හල 2013 දී ආරම්භ කරන ලදී. මුල් බලාගාරය එක් එක් පිරවුම් රේඛාවේ එකම යන්ත්‍ර වලින් සමන්විත විය. මෙම යන්ත්‍ර විද්‍යාත්මකව LPG කර්මාන්තය සඳහා නිර්මාණය කර ඇති අතර අද දක්වා ක්‍රියාත්මක වේ. | පරිශීලකයින්ගේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා සමාගම විසින් පිරවුම් කම්හලේ ගුණාත්මකභාවය සහ ආරක්ෂණ පරීක්ෂාවන් වැඩිදියුණු කළ යුතුය. |
| (iv.) සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද හිස් සිලින්ඩර සඳහා නිෂ්පාදන වර්ෂය, ප්‍රතිසංස්කරණය කළ වර්ෂය, යෝග්‍යතා වර්ෂය සහ බැහැර කළ යුතු වර්ෂය වැනි තොරතුරු ඇතුළුව කාණ්ඩ වශයෙන් සිලින්ඩර හඳුනා ගැනීම සඳහා දත්ත සමුදාය නඩත්තු කර නොතිබුණි. | අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා පහත ලේඛන පවත්වාගෙන යනු ලැබේ.<br>1.නිෂ්පාදන වර්ෂය - අවශ්‍ය වාර්තා සහ අදාළ සියලු තොරතුරු ඇත.<br>2.අළුත්වැඩියා කිරීමේ වර්ෂය - සිලින්ඩරයේ සලකුණු කර ඇත. ලිට්‍රෝ සෑම දිනකම සිලින්ඩර ගණන සමඟ වාර්තාවක් පවත්වාගෙන යයි.<br>3. සුදුසුකම් ලබන වර්ෂය - සිලින්ඩරයේ සලකුණු කර ඇත.<br>4.ඉවතලන වර්ෂය - සිලින්ඩරයේ ආයු කාලය කලින් තීරණය කර | අවශ්‍ය විටෙක අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා සමාගම විසින් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |

| | | |
|---|---|---|
| | නොමැත. සුදුසුකම් පරීක්ෂාවෙන් සැහීමකට පත්වන තාක්කල් එය භාවිතා කළ හැකිය. | |
| (v.) නිෂ්පාදන වර්ෂය වැනි තොරතුරු ඉවතලන සිලින්ඩරවලට අදාලව නඩත්තු කර නොතිබුණි. ඉවතලන සිලින්ඩරවල නිෂ්පාදන වර්ෂය සැලකිල්ලට නොගෙන පොත්වල පැරණිතම සිලින්ඩරවලින් බැහැර කිරීමේ සිලින්ඩර අඩු කර ඇත. | ෂෙල් ගෑස් කාලපරිච්ඡේදයට පෙර සිට සිලින්ඩර ප්‍රමාණය පිළිබඳ නිසි වාර්තා නොමැත. ඒ නිසා 2000 අවුරුද්දේ Shell සමාගම සිලින්ඩර් ගහනය හොයන්න සමීක්ෂණයක් කරලා තිබුණා. එම ප්‍රතිඵලය මත මේ දක්වා වාර්තාව පවත්වාගෙන ගියා. | බැහැර කිරීමට පෙර සිලින්ඩර හඳුනා ගැනීමට සහ ඒ අනුව වත්කම් වාර්තා යාවත්කාලීන කිරීමට සමාගම නිසි ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කළ යුතුය. |
| (vi.)සුදුසුකම් ලැබීමට (requalification) පෙර සහ සුදුසුකම් ලැබීමෙන් පසු සිලින්ඩරවල ආයු කාලය වසර 15ක් වුවද, සුදුසුකම් ලැබීමට පෙර සහ සුදුසුකම් ලැබීමෙන් පසු මුළු සිලින්ඩර ගණන ජීවිත කාලය ඉක්මවන බව සොයා ගැනීමට කිසිදු ක්‍රමයක් නොතිබුණි. | මෙහෙයුම් ක්‍රියා පටිපාටියට අනුව, ලිට්‍රෝ කර්මාන්ත ශාලාව තුළ දී සෑම සිලින්ඩරයක්ම දෘෂ්‍යව පරීක්ෂා කර සුදුසුකම් ලැබීම සඳහා සිලින්ඩර වෙන් කරයි. සිලින්ඩර පිරිවැටුම් අනුපාතය පාරිභෝගික භාවිතය මත රඳා පවතී. බලාගාරයට ආපසු එන සිලින්ඩර මාසයක සිට වසර කිහිපයක් දක්වා වෙනස් වන බව නිරීක්ෂණය වේ. කර්මාන්ත ශාලාවට එන සිලින්ඩර සාම්පලයක් විශ්ලේෂණය කිරීමෙන් අපට කළ හැක්කේ ඇස්තමේන්තු කිරීම පමණි. | සමාගම විසින් සිලින්ඩර සෑම විටම පිළිගත් ගුණාත්මක බව සහතික කළ යුතු අතර පාරිභෝගික ආරක්ෂාව සහතික කළ යුතුය. |
| (vii.)කපාටයේ (valve) ආයු කාලය වසර 15ක් වුවද, එහි ආයු කාලය ඉක්ම වූ මුළු කපාට සංඛ්‍යාව සොයා ගැනීමට ක්‍රමයක් නොතිබුණි. | අපගේ සිලින්ඩරවල කපාට සියල්ලම පාහේ අවුරුදු 15 ට අඩුය. පහත සඳහන් අවස්ථා වලදී, අපි කපාටය පරීක්ෂා කර ප්‍රතිෂ්ඨාපනය කරන්නෙමු.<br>1. සිලින්ඩර සුදුසුකම් ලැබූ විට -<br>2. හිස් සිලින්ඩරය කර්මාන්ත ශාලාවට බාන විට - දෘශ්‍ය පරීක්ෂාවෙන් පසු කපාට ප්‍රතිස්ථාපනය සඳහා සිලින්ඩරය ඉවත් කරනු ලැබේ.<br>3. පසු පිරවීමේ පරීක්ෂාව - ඉලෙක්ට්‍රෝනික කාන්දු අනාවරකය (detector) පරීක්ෂා කරන්න. | සමාගම විසින් සෑම විටම පිළිගත් ගුණාත්මක බව කපාට වල සහතික කළ යුතු අතර පාරිභෝගික ආරක්ෂාව සහතික කළ යුතුය. |
| (viii.) සමාගම සමඟ ගනුදෙනු කර ඇති තොග ගනුදෙනුකරුවන් ගණන 83 කි. නමුත් විගණනයට ලැබී ඇත්තේ | ඉතිරි ගිවිසුම් මුලා අංශය සතුව ඇති අතර ඕනෑම වේලාවක පරීක්ෂා කළ හැක. | සමාගම විසින් සෑම තොග පාරිභෝගිකයෙකු සමඟම වලංගු ගිවිසුමක් පවතින බවට |

| | | |
|---|---|---|
| ගිවිසුම් 31ක් පමණයි. එබැවින්, ඉතිරි තොග පාරිභෝගිකයින් 52 සමඟ සමාගම ගිවිසුම්වලට එළැඹී ඇත්ද යන්න තහවුරු කිරීමට නොහැකි විය. | | සහතික විය යුතු අතර එම ගිවිසුම් විගණනය සඳහා පවතින බවට සහතික විය යුතුය. |
| (ඉ) තොග සහ වාණිජ පාරිභෝගිකයින් සඳහා මිල ගණනය කිරීම, ප්‍රොපේන් වලින් සියයට 30 ක් සහ බියුටේන් වලින් සියයට 70 ක් මත පදනම්ව කොන්ත්‍රත් මිල තීරණය වේ. ප්‍රොපේන් මිල බියුටේන් මිලට වඩා වැඩි වූ අවස්ථා වලදී එම ගණනය කළ කොන්ත්‍රත් මිල මිලට වඩා සත්‍ය කොන්ත්‍රත් මිල මිල වැඩි බවත් ආනයනය කරන ලද LPG හි ප්‍රොපේන් සංයුතිය සියයට 30 ට වඩා වැඩි බවත් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, තොග සහ වාණිජ පාරිභෝගිකයන් සඳහා මිල තීරණය කිරීම සඳහා සලකා බලන ආනයනික නිෂ්පාදන පිරිවැය සත්‍ය ආනයනික නිෂ්පාදන පිරිවැයට (IPC) වඩා වැඩි විය. 2021 වර්ෂය තුළ මාස 10 ක් තුළ ප්‍රොපේන් මිල බියුටේන් මිලට වඩා ඉහළ අගයක් ගත් බවත්, LPG හි ආනයනික ප්‍රොපේන් සංයුතිය ඇතැම් අවස්ථාවල දී සියයට 30 ට වඩා වැඩි බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය. | වානිජ මිල සෑම විටම ප්‍රොපේන් 30% සහ බියුටේන් 70% මත පදනම් වේ. ඒ වගේම මේ අවුරුද්දේ තමයි ප්‍රොපේන් මිල වැඩි වෙලා තියෙන්නේ. එක් එක් නැව්ගත කිරීම සඳහා මිල නියම කිරීම ප්‍රායෝගික නොවේ. | වාර්ෂික ටෙන්ඩර් කොන්දේසි අනුව වාණිජමය වශයෙන් මිල තීරණය කිරීමේදී සංයුතියේ උච්චාවචනයන් ඇතුළත් කිරීමේ හැකියාව සමාගම සෙවිය යුතුය. |
| (ඊ) CAA හි සභාපතිවරයාට යවන ලද 2021 පෙබරවාරි 02 දිනැති ලිපියට අනුව, සමාගම විසින් 12.5kg, 5kg and 2.3kg යන සිලින්ඩර් වල මිල සංශෝධනයක් ඉල්ලුම් කල අතර (2021 ජනවාරි සහ පෙබරවාරි වියදම් මත පදනම්ව කොළඹ සඳහා ඉල්ලුම් කළ මිල පිළිවෙලින් රු. 2,204, රු. 882 සහ රු. 419) 2021 මාර්තු 26 දින භාණ්ඩාගාර ලේකම් වෙත යවන ලද ලිපියට අනුව, සමාගම විසින් කර්මාන්තයේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා 2021 අප්‍රේල් 20 සිට ක්‍රියාත්මක වන පරිදි රු.1,850 සිට රු.1,900 දක්වා මිල වැඩි කිරීමක් යෝජනා කර ඇත. තවද, 2021 ජූනි 28, 2021 ජූලි 12 සහ 2021 අගෝස්තු 11 දිනැති CAA හි සභාපතිවරයා වෙත යවන ලද ලිපිවලට අනුව, සමාගම විසින් 2021 ජනවාරි සිට 2021 ජූලි දක්වා බදු පෙර අලාභය රුපියල් බිලියන 6 ඉස්මතු කරමින් මිල සංශෝධනයක් ඉල්ලා | වාණිජ මිල ගණන් වෙළඳපල සහ ව්‍යාපාරික තත්ත්වය මත පදනම් වන අතර එහි කොන්ත්‍රත් මිල, විනිමය අනුපාතය සහ තරඟකාරී මිල මත පදනම්ව සෑම මසකම සංශෝධනය වේ. කෙසේ වෙතත්, 2020/2021 කාලය තුළ වාණිජ අංශය සැලකිය යුතු ලාභයක් ලබා ඇත. මෙම අංශය තනි අංශයක් ලෙස ක්‍රියා කරන අතර සෑම විටම සමස්ත සමාගමේ කාර්ය සාධනයට ධනාත්මක ලාභ එකතු කරයි. | සමාගමට සිදුවන පාඩු වළක්වා ගැනීමට සහ එම කොටස්වලින් ප්‍රමාණවත් දායකත්වයක් උපයා ගැනීමට තොග සහ වාණිජ පාරිභෝගිකයන් සඳහා පිරිවැය පදනම් කරගත් මිලකරණ ක්‍රමයක් සමාගම විසින් යෙදිය යුතුය. |

තිබුණි. ඉහත පරිදි දේශීය නිෂ්පාදන සඳහා මිල සංශෝධන ඉල්ලා තිබුණද, 2020 සහ 2021 වසර තුළ තොග සහ වාණිජ පාරිභෝගිකයින්ට ශුද්ධ වට්ටම් (දළ අලාභය) ලබා දී ඇති අතර, තොග වශයෙන් සහ වාණිජ ගනුදෙනුකරුවන් සඳහා LPG සැපයීමේ දි මිල නියම කිරීමේ බලය සමාගමට පවා ඇත.

### 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) වාහන සහ සුන්බුන් සිලින්ඩර බැහැර කිරීම | | |
| (i.) 2020 සැප්තැම්බර් 22 සහ 2021 මාර්තු 30 යන දිනවලදී පිළිවෙළින් වාහන 19ක් සහ එක් වාහනයක් ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති බව නිරීක්ෂණය වූයේ රජය 2020 මැයි 21 දින 2176/19 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වාහන ආනයනය තහනම් පනවා තිබූ පසුබිමකය. අධ්‍යක්ෂ මණ්ඩලය 2020 සැප්තැම්බර් 23 වන දින පැවති රැස්වීමේදී සමාගමේ වාහන ප්‍රතිපත්තියේ නව සංශෝධන අනුමත කර ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති අතර ඒ අනුව නිලධාරීන් 23 දෙනෙකු සඳහා ශුන්‍ය පොලී අනුපාත යටතේ සේවක වාහන ණය ප්‍රදානය කර එම ණයවලින් සියයට 50ක් කපාහැර ලබා දී ඇති බව සහ නිලධාරීන් 33 දෙනෙකු සඳහා ශුන්‍ය පොලී අනුපාත යටතේ රැකියා ආශ්‍රිත වාහන ණය ලබා දී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | සමාගමේ කටයුතු කරගෙන යාමේදී සමාගම අවංකත්වය පවත්වා ගත යුතු අතර රජයේ ප්‍රතිපත්ති තීරණවලින් පිටස්තර පාර්ශවයන්ට ප්‍රයෝජන ගැනීමට ඉඩ නොදිය යුතුය. |
| (ii.) වාහන 19 ක් රු. 50,097,341කට අලවි කල අතර (වැට් බද්ද නොමැතිව) එම වාහනයන්හි තක්සේරු වටිනාකම රු. 66,450,000 කි. එබැවින්, ඔවුන්ගේ තක්සේරුවට සාපේක්ෂව විකුණුම් වටිනාකමේ අඩුවීම රු. 16,352,659 කි. තවද තවත් වාහනයක් රුපියල් 13,425,926කට (වැට් බද්ද නොමැතිව) අලෙවි කර තිබූ අතර එය එහි තක්සේරුවට වඩා රුපියල් 1,974,074ක් අඩු විය. රජය විසින් පනවා ඇති වාහන ආනයනය තහනම් කිරීම හේතුවෙන් වාහනවල මිල වැඩි වීම මෙම වාහන ඉවත් කිරීමේදී සලකා බැලුවේද යන්න විගණනයට සැක සහිතය. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | |

| | | |
|---|---|---|
| (iii.)2021 මාර්තු 04 වැනි දින ඇස්තමේන්තුගත බර කිලෝග්‍රෑම් 196,923 ක් වූ ඉවතලන සිලින්ඩර තොගයක් රුපියල් 7,248,481 කට (වැට් බද්ද හැර) නව ටෙන්ඩර් කැඳවීමකින් තොරව කිලෝග්‍රෑමයකට රු. 65 කට පෙර, 2020 සැප්තැම්බර් 08 වැනි දින ඉවතලන ලද මිල ගණන් ඉදිරිපත් කළ ගැනුම්කරුට අලෙවි කර ඇත. . | කළමනාකාරීත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.)ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය පිටුදැකීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් 2021 මැයි 10 සහ 2021 මැයි 12 දිනැති ලිපි වලට අනුව,වසංගතය හේතුවෙන් රටේ හදිසි ජාතික අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් හදිසි අවශ්‍යතා සඳහා තොග ගොඩ නැගීම සඳහා වෛද්‍ය වායුමය ඔක්සිජන් විවිධ ප්‍රමාණයේ වෛද්‍ය වායු ඔක්සිජන් සිලින්ඩර 21,000 ක අමතර අවශ්‍යතා සපුරාලීමට සමාගමෙන් ඉල්ලා තිබුණි. 2021 මැයි 13 වන දින පැවති රැස්වීමේදී සමාගම තුළ පවතින ඩොලර් මිලියන 10 ක පමණ වටිනාකමකින් යුත් ඔක්සිජන් සැපයීමේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස මෙය සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ පහත දැක්වේ.<br>(i.) හදිසි ප්‍රසම්පාදනයට අදාළ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 3.8.1 වගන්තියට අනුව, 2.14 මාර්ගෝපදේශය යටතේ නියම කර ඇති මූල්‍ය සීමාවන් ඉක්මවා ප්‍රසම්පාදන ආරම්භ කිරීම සඳහා පවතින පළමු අවස්ථාවෙහිදී අදාළ බලධාරීන්ගෙන් විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. කෙසේ වෙතත්, ප්‍රසම්පාදනයේ වටිනාකම රුපියල් මිලියන 500 ඉක්මවන ප්‍රසම්පාදනය ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලයෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.<br>(ii.) 2.14.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ඉතා හදිසි සහ සුවිශේෂී අවස්ථාවන්හිදී ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරවීම සඳහා මිලියන 10කට වැඩි ප්‍රසම්පාදනයක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු බව නිරීක්ෂණය විය. ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම සඳහා සමාගම එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.<br>(iii.) සුදුසු ප්‍රසම්පාදන කමිටුවක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් නොකර ප්‍රසම්පාදන | සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද හදිසි ප්‍රසම්පාදන ක්‍රමය යටතේ සාජ්පු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඇත. ඇමරිකානු ඩොලර් මිලියන 10 ක අයවැය තුළ ඕනෑම මූල්‍ය පිරිවැයක් අනුමත කිරීමේ බලය සභාපතිවරයාට සහ ප්‍රධාන විධායක නිලධාරියාට ලබා දී ඇත. ඔක්සිජන් ව්‍යාපෘතිය සඳහා තමන්ගේම අරමුදල් යොදවන ලෙස රේඛීය අමාත්‍යාංශය ලිට්‍රෝ සමාගමට පැහැදිලිව දැනුම් දුන්නා. ප්‍රසම්පාදනය තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් ලබා ගැනීමට තීරණය කර විධිමත් TEC සහ PC පත් නොකර සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ අනුමැතිය මත මිලදී ගැනුම් ඇනවුම් නිකුත් කරන ලදී. ඉතා කෙටි කාලයක් තුළ හදිසි ප්‍රමාණ සැපයීමට කැමති දැනට සිටින සැපයුම්කරු වෙත ප්‍රසම්පාදනය ලබා දුනි. මිලදී ගැනීමේදී ශ්‍රී ලංකාවේ පවතින වෙළඳපල මිල සමඟ මිල සංසන්දනය කරන ලදී; කෙසේ වෙතත්, සියලුම මිලදී ගැනීම් සිදු කර ඇත්තේ ශ්‍රී ලංකාවේ වෛද්‍ය ඔක්සිජන් සිලින්ඩරවල පවතින වෙළඳපල මිලට වඩා අඩුවෙනි.<br><br>ලිට්‍රෝ හි ඉක්මන් ප්‍රතිචාරය | සමාගම හදිසි ප්‍රසම්පාදන සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි දක්වා ඇති ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතු අතර ප්‍රසම්පාදනය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවකදීම අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මාර්ගෝපදේශයේ 3.8 හෝ 2.14 අනුව සුදුසු ප්‍රසම්පාදන ක්‍රමයක් තෝරා නොගෙන, සැපයුම්කරුවන් දෙදෙනාගෙන් ඔක්සිජන් පිරවූ සිලින්ඩර 4,930ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන අංශය තීරණය කර තිබුණි. | හේතුවෙන්, දැනට සිටින අය විසින් අපේක්ෂිත වෛද්‍ය ඔක්සිජන් සැපයුම වැඩි කර ඇත. එබැවින්, වසංගත අවස්ථාවේ වෛද්‍ය ඔක්සිජන් සැපයුම කළමනාකරණය කිරීමට මෙම මූලපිරීම රජයට සහාය විය. | |
| (iv.) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.8 ට පටහැනිව, සිලින්ඩර 4,930 ක් ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන් සමඟ ලිඛිත ගිවිසුමක් අත්සන් කර නොතිබුණි | | |
| (v.) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.4 ට පටහැනිව, සිලින්ඩර 400 ක් සඳහා 62.5% අත්තිකාරම් මුදල රුපියල් මිලියන 10.15 ක් , සිලින්ඩර 200 ක් සඳහා 100% අත්තිකාරම් මුදල රුපියල් මිලියන 7.16 ක් සහ අත්තිකාරම් ගෙවීමක් සහතිකයක් (guarantee) ලබා ගැනීමකින් තොරව සිලින්ඩර 4,330 සඳහා ඩොලර් 100,000 (රු. මිලියන 20.3) ගෙවා ඇත. | පහත හේතූන් නිසා සමාගම අත්තිකාරම් ගෙවීමේ සහතිකයක් ලබාගෙන නොමැත.<br><br>- රෝහල්වලට වෛද්‍ය ඔක්සිජන් සිලින්ඩර සැපයීමේ හදිසි අවශ්‍යතාවය සලකා බලා, ලිට්‍රෝ සඳහා වෙන් කර ඇති තොග තබා ගැනීම සඳහා සුළු LC සමඟ ගෙවීම කල්තියා නිකුත් කිරීමට තීරණය කරන ලදී. ඇපකර සැකසීමේ කාලය අඩු කිරීමට සහ ප්‍රසම්පාදන කාලය විශාල වශයෙන් කෙටි කිරීමට අත්තිකාරම් ඇපකරය ඉවත් කරන ලදී.<br><br>- Litro ඔහුන්ගේ පෙර හැසිරීම මත සැපයුම්කරු කෙරෙහි විශ්වාසය තබයි. අත්තිකාරම් ගෙවීමෙන් පසු සැපයුම්කරු සහතිකයක් නොමැතිව අතීතයේ සිට අඛණ්ඩව අවශ්‍ය භාණ්ඩ සපයමින් සිටියේය. | අත්තිකාරම් ගෙවීමේ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව සමාගම විසින් අත්තිකාරම් ගෙවීමක් නොකළ යුතුය. |
| (vi.) | සිලින්ඩර 600 සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර නිෂ්පාදනයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා සාම්පල ලබාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | නියමිත වේලාවට බෙදා හැරීමේ හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් සාම්පල ලබාගෙන නොමැත. | ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට පෙර නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා සමාගම විසින් සාම්පල ලබා ගත යුතුය. |
| (vii.) | ඔක්සිජන් පිරවූ සිලින්ඩර හාරසියයක් (400) සැපයුම්කරු විසින් ලබා දී ඇතත්, සිලින්ඩර නිසි ලෙස නඩත්තු කර නොමැති අතර සිලින්ඩර් | ලැබුණු වෛද්‍ය ඔක්සිජන් වෛද්‍ය සැපයුම් අංශය විසින් අනුමත කරන ලදී. විශේෂ TEC | මෙම ප්‍රසම්පාදනයේදී සමාගමට සිදු වූ පාඩුව අයකර ගැනීමට සමාගම |

| | | | |
|---|---|---|---|
| | විශාල වශයෙන් භාවිතා කර ඇති අතර එය අභ්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් නොවේ. සැපයුම්කරුගේ එම නොසැලකිලිමත් ක්‍රියාකලාපය හේතුවෙන් සමාගමට සිදුවී ඇති ඇස්තමේන්තුගත මුළු හානිය ඇමෙරිකානු ඩොලර් 126,782 ක් බවත්, එම මුදල සැපයුම්කරුගෙන් පියවන ලෙස සමාගම ඉල්ලා සිටි බවත් වැඩිදුරටත් ප්‍රකාශ කෙරිණි. 2021 ජුනි 23 දිනැති විද්‍යුත් තැපෑලෙන් ලීටර් 47 ක ධාරිතාවකින් යුත් සිලින්ඩර 100 ක් සැපයීමට සැපයුම්කරු එකඟ වී ඇත. කෙසේ වෙතත්, හානියට පත් නිෂ්පාදනවල අලාභය අයකර ගැනීම සඳහා එකඟ වූ ලීටර් 47 ධාරිතාව සහිත සිලින්ඩර අංක 100 හෝ ඉල්ලා සිටි වන්දිය සමාගම වෙත ලැබී නොතිබුණි. | විසින් ලැබුණු සිලින්ඩර නිර්දේශ කර ඒ අනුව වලංගු කර ඇත. FOC පදනම යටතේ සිලින්ඩර 100 ක් යැවීමට සැපයුම්කරු එකඟ වුවද. සිංගප්පූරුවේ සිට කොළඹට EXW නැව්ගත කිරීමේ හැකියාව ලිට්රෝ සමාගමට නොමැති වීම සහ ලිට්‍රෝ මගින් වෛද්‍ය ඔක්සිජන් පිරවීමේ ක්‍රියාවලියේ ගැටලු මතුවීම නිසා මෙම ප්‍රමාණය මිලදී නොගැනීමට තීරණය විය. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (viii.) | ප්‍රසම්පාදන අංශය ඉල්ලා සිටි සෞඛ්‍ය බලධාරීන්ගේ අනුමැතිය සහ අනෙකුත් සැපයුම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් මිලදී ගැනීමේ ඇණවුම අවලංගු කර ඇත.කෙසේ වෙතත්, සැපයුම්කරු සැපයුම් සහ පිරවුම් වියදම් සඳහා දරන ලද පිරිවැය හේතුවෙන් අවලංගු කිරීම පිළිගත්තේ නැත. තවද, 2021 නොවැම්බර් 08 වැනි දින ඔවුන්ගේ ශේෂය ඩොලර් 583,790 ක් අයකර ගැනීම සඳහා ඉල්ලුම් ලිපියක් ඔවුන් විසින් ගෙවන දිනට දරන ලද සියලු වියදම්/ගාස්තු සමඟ යවා ඇත. ඒ අනුව ඩොලර් 100,000 ක අත්තිකාරම් ගෙවීමෙන් සමාගම මේ වන විටත් රුපියල් මිලියන 20.3 ක පාඩුවක් ලබා ඇති බව නිරීක්ෂණය විය. | පැහැදිලි කළ පරිදි, වසංගතය තුළ වෛද්‍ය ඔක්සිජන් ලබා ගැනීම පහසු නැත, මන්ද වෛද්‍ය ඔක්සිජන් සඳහා වන මුළු ලෝකයේම ඉල්ලුම වැඩි වී ඇති නමුත් සැපයුම සීමිත බැවිනි. ඊට අමතරව රෝහල් වෙනුවෙන් ආරක්ෂිත තොග තබා ගන්නා ලෙස ලිට්‍රෝ සමාගමෙන් ඉල්ලා සිටි අතර හදිසි වෛද්‍ය ඔක්සිජන් ලබා ගැනීමට අපට සිදු වූ බැවින් අත්තිකාරම් මුදල තවදුරටත් ප්‍රමාද නොකර ගෙවීමට තීරණය විය. කෙසේ වෙතත්, ව්‍යාපාරයේ ස්වභාවය අනුව මතුවන ප්‍රතිවිරෝධතා හේතුවෙන් අනුමත කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. රජයේ රෝහල්වලට වාණිජමය වශයෙන් වෛද්‍ය ඔක්සිජන් සැපයීම සිදුකිරීමට නිසි ව්‍යාපාරික බලපත්‍රයක් තිබීම අවශ්‍ය වේ. එබැවින්, ඇණවුම අවලංගු කිරීමට තීරණය විය. කෙසේ වෙතත් තවමත් බලධාරීන් සහ ලිට්‍රෝ කළමනාකාරිත්වය විසින් අනුමත කරනු ලැබුවහොත් සැපයුම්කරුගේ ස්ථානයෙන් සිලින්ඩර නැව්ගත කිරීමට සූදානම්ය. | සමාගම විසින් සුදුසු අධිකාරියකින් උපදෙස් ලබාගෙන ඇණවුම් කළ භාණ්ඩ ලබාගැනීමට හෝ සැපයුම්කරුට ගෙවූ මුදල අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ.) 2020 මාර්තු 01 සිට 2022 පෙබරවාරි 28 දක්වා වසර දෙකක කාලය සඳහා LPG සැපයීම සඳහා ප්‍රසම්පාදනය. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | අදාළ බලධාරීන් සහ සමාගම ආයතනය තුළ සදාචාරාත්මක සංස්කෘතිය ප්‍රවර්ධනය කළ යුතු අතර විනිවිදභාවයෙන් යුතුව ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය සිදුකිරීමට හැකිවන පරිදි සමාගම තුළ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කළ යුතුය. |
| (i.) ටෙන්ඩර් ලේඛන වල උපලේඛනයේ 7(a) වගන්තියට අනුව, CIF මිල ප්‍රොපේන් සහ බියුටේන් සඳහා නාමයෝජනා කරන මාසයේ සෞදි කොන්ත්‍රාත් මිල (CP) සහ මෙට්‍රික් ටොන් එකක් සඳහා භාණ්ඩ ප්‍රවාහන හා රක්ෂණ ගාස්තු මත පදනම් විය යුතු අතර ලංසුකරුවන්ට උපදෙස් (ITB - Instructions to Bidders ) හි 14.2 වගන්තියට අනුව, මිල කාලසටහනේ ඇති ඕනෑම භාණ්ඩයකට එරෙහිව ඕනෑම වට්ටමක් හෝ විශාල වශයෙන් වට්ටමක් ලංසුකරුට පිරිනැමිය හැකිය.ඉහත වගන්තිවලට පටහැනිව, සුදුසුකම් ලත් ලංසුකරු විසින් CP වෙත වාරිකයක් ( premium) ඉදිරිපත් කර ඇත. [සුදුසුකම් ලත් ලංසුකරුගේ මූල්‍ය ලංසුව CP + 54 USD (CP වෙත වාරිකයක් ලෙස) + 52.9 USD (භාණ්ඩ ප්‍රවාහනය සහ රක්ෂණ ගාස්තු ලෙස) විය. | | |
| (ii.) ලංසු දත්ත පත්‍රිකාවේ ITB 35.4 වගන්තියට අනුව, මූල්‍ය ලංසුව ඇගයීමේදී, සේවායෝජකයා විසින් අදාළ ITB වගන්තිවලට අනුව ලංසු මිල ගළපමින් එක් එක් ලංසුව සඳහා ඇගයීම් කළ ලංසු මිල තීරණය කරනු ඇත. ඕනෑම වෙනස්කමක්, අපගමනයක් හෝ විකල්ප දීමනාවක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ගැනුම්කරුට අයිතිය ඇත. ලංසු ලේඛනයේ අවශ්‍යතාවයට වඩා වැඩි වෙනස්කම්, අපගමනය, විකල්ප දීමනා සහ අනෙකුත් සාධක ලංසු ඇගයීමේදී සැලකිල්ලට නොගනී. ප්‍රතිපාදනයට පටහැනිව, වසර දෙකක කාලසීමාවේ කොන්ත්‍රාත්තුව සඳහා කොන්ත්‍රත් මිල හැර වෙනත් ස්ථාවර අනුපාතයක් ලෙස සඳහන් කරන ලද කොන්ත්‍රත් මිලට අදාල වාරිකය (premium) පිළිගෙන තිබුණි. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | |
| (iii.) 2020 මාර්තු සිට 2021 දෙසැම්බර් දක්වා සැබෑ ආනයනික LPG ප්‍රමාණයට අනුව, කොන්ත්‍රත් මිලට අදාල වාරික (premium) වශයෙන් USD 34,610,800.5 ගෙවා ඇත. (640,940.75 MT X 54 USD) සහ එය සාමාන්‍ය විනිමය අනුපාතය ඇ.ඩො එකක් රු.194.08 පදනමින් ආසන්න වශයෙන් රු. බිලියන 6.72 කි. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | |
| (iii.) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් LPG සැපයුම් කොන්ත්‍රාත්තුව වසර දෙකකට දීර්ඝ කිරීමේ යෝජනාව සම්මත කර ඇත්තේ (පෙර කොන්ත්‍රාත්තුව වසරකට සීමා විය) "එමගින් පරිමාව අනුව භාණ්ඩ ප්‍රවාහනය සහ රක්ෂණය සඳහා සමාගමට වැඩි තරඟකාරී ගාස්තුවක් ලබා දෙනු ඇත" යන කරුණ සැලකිල්ලට භාජනය කරමින් 2019 | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | |

| | | | |
|---|---|---|---|
| | ඔක්තොම්බර් 03 දින පැවති එහි රැස්වීමේදී සහ 2019 දෙසැම්බර් 27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එය අනුමත කරන ලදී. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් මිලට අදාලව වාරිකය ඉදිරිපත් කිරීම සහ භාර ගැනීම හේතුවෙන් LPG සැපයුම් කොන්ත්‍රාත්තුව වසර දෙකකට දීර්ඝ කිරීම මගින් ඉහත අරමුණ ඉටු වී නොතිබුණි. | | |
| (iv.) | මෙම ප්‍රසම්පාදනයේදී අවසානයේ සලකා බැලීම සඳහා එක් ලංසුවක් පමණක් තිබී ඇති අතර, ලංසුකරුවන් 10 දෙනෙකු ලංසු ලියකියවිලි මිලදී ගෙන ඇති අතර, ලංසුකරුවන් හතර දෙනෙකු සිය ලංසු ඉදිරිපත් කර තිබුනද, අවසාන ප්‍රතිඵලය ලැබී තිබුනේ, මෙහි ප්‍රධාන සැපයුමක් සඳහා තිබිය යුතු නිසි තරඟයකින් තොරවය. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | |
| (vi.) | 2020 පෙබරවාරි 29 වැනි දින LPG සැපයීම සඳහා ඇති කර ගත් ගිවිසුම අවසන් වුවද, 2020-2022 වසර සඳහා LPG සැපයීම සඳහා ප්‍රසම්පාදන දැන්වීම 2019 ඔක්තෝබර් 20 දින ප්‍රචාරය කර තිබුණි. එසේම, 2019 දෙසැම්බර් 04 වන දින ලංසු විවෘත කර ඇති අතර අවසාන SCAPC රැස්වීම 2020 ජනවාරි 02 දින පැවැත්විණි. එබැවින් කාලය සීමා වීම හේතුවෙන් මුල්‍ය ලංසු ඇගැයීම් සඳහා නිසි තරගයක් නිර්මාණය වී නොතිබූ තත්ත්වයක් තුළ පවා නැවත ලංසු කැඳවීමට අවස්ථාවක් නොතිබූ බව නිරීක්ෂණය විය. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මණ්ඩලයට අදාල පත්වීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 20 දිනැති ලිපිය මගින් මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා විසින් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු පත් කර තිබුණි. සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති සහ සමාගම් ලේකම් විසින් පිළිවෙලින් 2020 ජනවාරි 22 සහ 2020 පෙබරවාරි 13 දිනැති ලිපිවලට අනුව, කළමනාකාර අධ්‍යක්ෂක ලෙස පත්කිරීම සඳහා ඉහත සඳහන් නාමයෝජනාව තහවුරු කරන ලදී. භාණ්ඩාගාරයේ නම් කිරීමට පටහැනිව, 2020 පෙබරවාරි 21 දින පැවති එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී ඔහු සමාගමේ විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. සියයට 99.94ක කොටස් හිමියා සහ සමාගමේ පරම අයිතිකරු (ultimate parent) වන මහා භාණ්ඩාගාරය ඉහත සඳහන් කළ නාමයෝජනාවට පටහැනිව, හිටපු | කළමනාකාර අධ්‍යක්ෂ ධූරය ඇතුළු සුදුසු වරප්‍රසාද සහිත ඕනෑම විධායක නිලයක් දරන්නෙකු ලෙස මණ්ඩලය විසින් වරින් වර තම ආයතනයෙන් එකක් හෝ කිහිපයක් පත් කළ හැකි බවට ව්‍යවස්ථාවෙන් කරුනු සපයයි. කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් කරන ලද අධ්‍යක්ෂවරයෙකු සේවයෙන් පහ කිරීමට යටත් වේ. ඔබ දන්නා පරිදි LGLL සහ LGTLL හි ප්‍රධාන කොටස් හිමියා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වන අතර මහා භාණ්ඩාගාරය නොවේ. එම නිසා මුදල් අමාත්‍යාංශය විසින් SLIC සභාපතිවරයාට සෘජුවම නාමයෝජනා ලබා දෙන අතර, SLIC හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි පරිදි පිහිටුවන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී එම නාමයෝජනා තීරණය කර අනුමත කළ | පාලනයේ මූලධර්මවලට පටහැනි වීම වළක්වා ගැනීම සඳහා මණ්ඩලයේ ආධිපත්‍යය දැරීමට කිසිදු පුද්ගලයෙකුට අසීමිත බලතල නොමැති වන පරිදි, කාර්යක්ෂම තීරණ ගැනීම සහ සමාගමේ කටයුතු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයේ බල හා අධිකාරියේ සමතුලිතතාවයක් සහතික කිරීම සඳහා මණ්ඩලයේ ප්‍රධානියාගේ සහ සමාගමේ මෙහෙයුම් |

| | | |
|---|---|---|
| සභාපතිවරයා එහි ප්‍රධාන විධායක නිලධාරී (කළමනාකාර අධ්‍යක්ෂවරයාට සමාන) ලෙස භාණ්ඩාගාරය ඉහත නම් කිරීමට පටහැනිව 2020 පෙබරවාරි 21 දින පවත්වන ලද රැස්වීමේදී පත් කර ඇත. | යුතු අතර, ඉන් පසුව SLIC විසින් සියලුම නාමයෝජනා LGLL සහ LGTLL හි අධ්‍යක්ෂක මණ්ඩලය වෙත දැනුම් දිය යුතුය. සභාපති/ප්‍රධාන විධායක නිලධාරියා නම් කිරීමේ බලය සහ අධිකාරිය සම්පූර්ණයෙන්ම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ. | ප්‍රධානියාගේ වගකීම් පැහැදිලිව බෙදීම නිර්දේශ කෙරේ. |